
# පුස්තකාල පුවෘත්ති
# நூலகம் செய்தி LIBRARY NEWS

11 වන කලාපය 3 – 4 1990 ජූලි දෙසැම්බර්



ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகம் செய்தி
# LIBRARY NEWS

**11 වන කලාපය 3/4**
**1990 ජූලි - දෙසැම්බර්**

**සංස්කාරක උපදේශක මණ්ඩලය**

**ඊශ්වරී කොරයා**
(සභාපතිනිය)

**එම්. එස්. යූ. අමරසිරි**
(වැඩ බලන අධ්‍යක්ෂ)

**නාලිනී ද සිල්වා**
(වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ)

**එච්. එම්. ගුණරත්න බංඩා**
(වැඩ බලන සහකාර අධ්‍යක්ෂ)

**ජානකී ප්‍රනාන්දු**
(වැඩ බලන සහකාර අධ්‍යක්ෂ)

ප්‍රධාන සංස්කාරක
**මිල්ටන් මලවිආරච්චි**

ලිපි කටයුතු හා සෝදුපත් කියවීම
**යුරිකා පද්මිණී මුණසිංහ**

කවර සැලසුම
**උපුල් ජයරත්න**

ඡායාරූප
**හේමන්ත අරුණසිරි**

පුස්තකාල ප්‍රවෘත්ති අන්තර්ගතය යුගයේ විශාපන අවශ්‍යතාවන්ට අනුකූල වනු පරිදි වෙනස් කිරීමට අප අදහස් කර ඇත. මේ වෙනස් කිරීම ඒකාධිකාරී හෝ අභිධාවනකාරීව සිදුවන්නක් නොව පාඨක ප්‍රතිචාරය මත අනුක්‍රමයෙන් සිදුවන්නකි.

මෙවර කලාපයට ජාතික පුස්තකාල දේශන මාලා දෙකක් එක්කරනු ලැබේ. පාඨක ඔබට අලුත් යමක් එක්කිරීමේ අදහසිනි. පුස්තකාල ප්‍රවෘත්ති පුස්තකාල ක්ෂේත්‍රයේ එකම ප්‍රකාශනය වේ. එහෙයින් ඔබගේ ප්‍රතිචාරය පුස්තකාල ප්‍රවෘත්ති නිතරම බලාපොරොත්තුවෙන් සිටී.

සංස්කාරක

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

පටුන


සිංහල අක්ෂර මාලාවේ උපත හා විකාශය — 3 - 7
මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා

**Conservation and Preservation of Library Materials in Sri Lanka** — 8 - 11
Mrs. Ishvari Corea and Mrs. D. M. Thilakaratne

ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගැටළු හා ප්‍රවණතා — 12 - 17
හෙන්රි සමරනායක මහතා

**Resources of the National Library of Sri Lanka** — 18 - 20
Mrs. Nalini de Silva

පුවත් ලුහුඬින් — 21- 22

# බීසා පුහුණු වැඩ සටහන – ඕස්ට්‍රේලියාව

**(BISA – Bibliographic and Information Services in Asia and Pacific)**

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා අංශය මගින් ආසියා හා පැසිපික් රටවල පුස්තකාල ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා පහත දැක්වෙන කෙටිකාලීන පුහුණු පාඨමාලා 1992 වර්ෂය සඳහා පැවැත්වීමට නියමිතව ඇත.

1. පරිගණක ආශ්‍රිත සූචිකරණ (Computer Based Cataloguing)
2. පුස්තකාල කළමනාකරණය (Library Management)
3. CDS/ISIS පරිගණක පද්ධතිය (CDS/ISIS Software Training)

පුස්තකාල කටයුතු පිළිබඳ විදේශීය රටක පුහුණුවක් ලබා ගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් පහත ලිපිනයට ලියා විමසන්න.

**Maureen Henninger,**
School of Librarianship,
University of New South Wales,
P. O. Box 1,
Kensington N.S.W. 2033,
Australia.

# පුස්තකාල ප්‍රවෘත්ති

ත්‍රෛමාසික ප්‍රකාශනය

ආරම්භය : 1973
සංස්කරණය ප්‍රකාශනය හා බෙදාහැරීම,
පර්යේෂණ හා සංවර්ධන අංශය.

කලාපයක මිල රු. 7.50
වාර්ෂික දායක මිල රු. 30.00
(තැ. ගා. සමග)

දායක මුදල් :
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමින්

විමසීම් හා ලිපි :
සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථන: 698847, 685201

# සිංහල අක්ෂර මාලාවේ උපත හා විකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
**මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා විසිනි**

ඊශ්වරී කොරයා මැතිනියනි, අධ්‍යක්ෂතුමනි, ගරු ස්වාමීන් වහන්ස, හිතවතුනි, අද ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ආරම්භ කරන ලද කථා මාලාවේ එක් අවස්ථාවක්. මේ කථාවේදී විශේෂයෙන්ම මම තෝරා ගත්තා සිංහල අක්ෂර මාලාවේ ප්‍රභවය සහ වර්ධනය කියන මාතෘකාව. මක් නිසාද? පුස්තකාලේ පළමු වැනි මහලේ ප්‍රදර්ශනයක් තියෙනව. එහි විශේෂ ස්ථානයක් දීලා තියෙනවා සිංහල අක්ෂර කොහොම ද ඇති වෙලා තියෙන්නේ කියලා කෙනෙකුට බලා ගන්න. නමුත් ඒ ප්‍රදර්ශනය නරඹන්න යන පුද්ගලයා කල්තියාම ඒ ගැන සාමාන්‍ය දැනීමක් ඇතිව ගියොත් තමයි තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ. දැන් ඒ ප්‍රදර්ශනය නරඹන්නට කල්තියා ලබා ගත යුතු අවබෝධය, වැටහීම ලබාගැනීම සඳහා උදව්වක් හැටියට මහ පෙන්වීමක් හැටියටයි මේ කථාව කෙරෙන්නෙ.

මේ කථාවේදී මගේ අවධානය යොමු වෙන්නේ නැහැ බ්‍රාහ්මී අක්ෂර මාලාවේ ඉතිහාසය සොයන්න. හුඟ දෙනෙක් ඒ ගැන කථා කරල තියෙනව. ඒ වගේම ලියලා තියෙනවා ප්‍රධාන වශයෙන්ම 7 වෙනි ශත වර්ෂය දක්වා බ්‍රාහ්මී අක්ෂර පාවිච්චි වෙච්ච හැටියට පුරා විද්‍යාඥයන් ශිලා ලේඛන පිළිබඳව, අක්ෂර පිළිබඳව පර්යේෂණ කරල ප්‍රකාශ කර තියෙන්නේ ක්‍රිස්තු පූර්ව 2 වෙනි ශත වර්ෂයේ ඉඳලා ක්‍රි.පූ. 7 වෙනි ශත වර්ෂය දක්වා කාලය බ්‍රාහ්මී අක්ෂර පාවිච්චි වුනු යුගයක් ලෙසයි. ඒ කියන්නේ අවුරුදු 900 ක් විතර දීර්ඝ කාලයක් තුළ බ්‍රාහ්මී අක්ෂර පාවිච්චි වෙලා 7 වෙනි ශත වර්ෂයෙන් පස්සෙදී ඒක වෙනස් වෙලා තියෙනවා. මේ වෙනස සිදු වුනේ කොහොමද කියන එකයි පළමුවෙන්ම විසඳාගන්නට තියෙන්නේ. මම හිතන්නේ ඒක සොයා ගත්තොතින් දැන් අපි පාවිච්චි කරන වර්ණ මාලාව කොහොමද හැදිලා තියෙන්නේ කියලා වටහා ගැනීම ඉතාමත්ම පහසු වෙනවා. දැන් මෙතන මේ බ්‍රාහ්මී අකුරු කියපුවහම මම හිතන්නේ කාටත් පේනවා මේ චාට් එකේ (1) ඉදිරිපත් කරලා තියෙනවා සිංහල අකුරුවලට කෙලින් බ්‍රාහ්මී අක්ෂර. මේවා තමයි උතුරු ඉන්දියාවෙන් පාවිච්චි වෙච්ච අක්ෂර. එතකොට ලංකාවෙත් මේ අක්ෂර එතරම් වෙනසකට පත් වෙලා නැහැ. ඇත්තටම ඒ ශත වර්ෂ 9 ක තරම් දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ ඉතාම සුළු වෙනස්කම් තමයි දක්නට ලැබෙන්නේ. එවැනි වෙනස්කම් සමහර විටෙක අද අපි සිංහල ලියන දෙතුන් දෙනෙකුගේ අකුරු එකට සංසන්දනය කරලා බැලුවහොත් ඒ අකුරුවලත් තියෙනව. ඒ අතරතුර සමහර අකුරුවල නව ශෛලියක් ගොඩ නැගෙන ආකාරයට පටන් ගැන්මක් වගේ දකින්න පුළුවන් අකුරුත් තියෙනව.


ඒ කෙසේ වුනත් ශත වර්ෂ 9 ක් ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර පාවිච්චි වෙලා ඊට පස්සෙදී 8 වෙනි ශතවර්ෂයේ නැත්නම් 7 වෙනි ශත වර්ෂයේ අග භාගයේ ඉඳල අළුත් අකුරු ක්‍රමයක්, සිංහල අකුරුයි කියල අපි ව්‍යවහාර කරන අකුරු ක්‍රමයට මාරු වුනේ ඇයි? මේක ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක්. ලංකා ඉතිහාසයේ සඳහන් වෙනවා මාන කියන කුමාරයෙක් පල්ලව රාජ්‍යයට ගිහිල්ල අවුරුදු 20 ක් එහි ගත කළා කියා. ඒ කුමාරයාගේ ළමයි තුන් දෙනා හැදුනේ වැඩුනේ එහේ. ඒ ළමයි තුන් දෙනා පස්වෙනි අග්ගබෝධි, තුන්වෙනි කස්සප, පළවෙනි මහින්ද හැටියට පස්සෙ රජ වුනා. එතකොට මේ මාන කුමරු පස්සෙ පල්ලව සේනාවක් සමග ලංකාවට ඇවිල්ල රාජ්‍ය බලය අල්ලාගෙන සිංහාසනාරූඪ වෙලා රට පාලනය කළා. එතකොට මේ පල්ලව සම්බන්ධය නැත්නම් පල්ලව දේශයට මාන ගිහිල්ල තියෙන්නේ ක්‍රි.ව. 670 විතර. ඒ කියන්නේ 7 වෙනි ශත වර්ෂයේ අග භාගයේ දී. දැන් මේ 7 වෙනි ශත වර්ෂයේ වෙනසට පල්ලව බලපෑමක් තියෙනවදැයි කියන එකයි මෙතන දී අපේ අවධානයට යොමු විය යුතුව තිබෙන්නේ. මාන කියල මෙහෙන් කුමාරයෙක් ගියා. ආපහු එන කොට මානවම්ම වෙලා ආවා. පල්ලව සංස්කෘතියේ බලපෑම එතන හොඳටෝම පැහැදිලියි.

ඊ ලඟට ලංකාවේ මූර්ති කලාව, කැටයම්, චිත්‍ර මේ තුනටම පල්ලව බලපෑම මේ යුගයේ ඉඳල ඉතාමත්ම පැහැදිලිව තියෙනවා. ඒවා විස්තර වශයෙන් මම ඉදිරිපත් කරන්නේ නැහැ මේ වෙලාවෙ. එතකොට රාජ්‍ය මට්ටමෙන් ඇති වෙච්ච මේ විපර්යාසය උඩ මේ විදියේ පසුබිමක් සකස් වීම තමයි හිටි ගමන්ම වාගේ ඒ කියන්නේ 7 වෙනි ශත වර්ෂයෙන් පස්සෙදී බ්‍රාහ්මී අක්ෂර මාලාව පාවිච්චි නොකර වෙනත් අක්ෂර මාලාවක් , සිංහල අක්ෂර මාලාව කියල පාවිච්චි කරන්න පටන් ගැනීම. මේකට අර මානවම්මගෙන් පටන් අර ගත්ත දේශපාලන නම්‍යතාවට අමතර වශයෙන් තව එක කාරණයක් පෙන්නුම් කරන්න පුළුවන්. ඒ තමයි මේ කාලය වෙන කොට ලංකාවේ මහායාන බලය සෑහෙන තරම් උග්‍ර වී තිබීම. ඒ කියන්නේ ලංකාව තන්ත්‍රයාන රටවල්වලින් එකක් හැටියට තන්ත්‍රයාන රටවල්වල ලැයිස්තුවක තිබෙනවා. අමෝඝවජ්‍ර හාමුදුරුවෝ ලංකාවේ ඉඳල වජ්‍රබෝධි හාමුදුරුවොත් එක්ක චීනයට ගියා. ජාවා රට හරහා ගිහිල්ල චීනයේ තන්ත්‍රයාන, විශේෂයෙන්ම මන්ත්‍රයාන බෞද්ධ සම්ප්‍රදය එහෙ ව්‍යාප්ත කළා. මෙ හාමුදුරුවෝ චීනයට ගියායින් පස්සෙදි චීන අධිරාජයා මතක් කළා ඔබ වහන්සෙ නැවත ලංකාවට ගිහිල්ල වැඩි වැඩියෙන් බෞද්ධ පොත් පත් සම්ප්‍රදය හදරලා, බෞද්ධ පොත්පත් ආදියත් අරගෙන චීනයට එන්න කියලා. ඒ හාමුදුරුවන්ට විතරක් නෙවෙයි ඒ හාමුදුරුවන්ගේ ගුරුවරයා වූ වජ්‍රබෝධි හාමුදුරුවන්ටත් එක්කයි ඒ ආරධනාව ලැබුනේ. මේ දෙන්නා චීනයේ ඉඳල ලංකාවට එන්න පිටත් වුන අතරමගදී වජ්‍රබෝධි හාමුදුරුවෝ අපවත් උනා. අමෝඝවජ්‍ර හාමුදුරුවෝ තවත් චීන ජාතිකයන් 37 දෙනෙක් සමගයි ලංකාවට ආවෙ. ඒ අතර චීන භික්ෂුන් වහන්සේලා දෙදෙනෙක් හිටිය. මේ ගොල්ලො අනුරාධපුරයේ නතර වෙලා අධ්‍යාපනය ලැබුවා. විශේෂයෙන් අමෝඝවජ්‍ර හාමුදුරුවෝ දළදා මාලිගාවෙ සමන්තභද්‍ර කියන මන්ත්‍රයාන ආචාර්යවරයා යටතේ අභිෂේකය ලබල ලංකාවෙන් මන්ත්‍රයාන පොත් පත් එකතු කර ගෙන චීනයට ගිහිල්ල චීනයට මන්ත්‍රයාන අභිෂේකය හඳුන්වල දීල, ලංකාවෙන් ගෙනිච්ච පොත් පත් චීන භාෂාවට

පරිවර්තනය කරල, ඒ වගේ විශාල සේවයක් කරල තියෙනව. මම හිතන්නේ චීනයේ ඉතාමත්ම උසස් විදියට පිළි අර ගත්ත, ගරු කරපු පුද්ගලයෙක් අමෝඝවජ්‍ර හාමුදුරුවෝ. මට වාසනාව ලැබුනා ඇත්ත වශයෙන් ම ඒ හාමුදුරුවො ඉදපු පන්සල බලන්න. සියාන් කියන ප්‍රදේශයේ පන්සලකයි ඒ හාමුදුරුවො නතර වෙලා ඉදල තියෙන්නෙ. එහි ශිලා ලිපියක් තියෙනව. මේ ඓතිහාසික විස්තර වැඩි වශයෙන්ම චීන වාර්තාවලයි ඇතුලත් වෙලා තියෙන්නෙ. දැන් මහායාන කියන මන්ත්‍රයාන ශාඛාව ලංකාවේ මේ කාලයේ දි තිබ්බව බව ඉතාමත්ම හොඳටෝම පැහැදිලි වෙනව. ඒ කියන්නෙ මන්ත්‍රයානය චීනයට ගියේ ලංකාවෙන්. එතකොට ශ්‍රී ලංකාව එක්තරා මන්ත්‍රයාන මධ්‍යස්ථානයක්. 7 වෙනි ශත වර්ෂයේ අග භාගයේ සිට. අපි දන්නවා 9 වෙනි ශත වර්ෂයේ දි පළවෙනි සේන රජ තුමාගෙ කාලයේ දි මහායානයේ අනෙක් ශාඛාව වන වජ්‍රයානයත් ලංකාවට ආවා. මේ යාන දෙක සාමාන්‍යයෙන් හඳුන්වනවා, දක්ෂිණාංශික තන්ත්‍රයානය, වාමාංශික තන්ත්‍රයානය කියල. දක්ෂිණාංශික තන්ත්‍රයානය කියන්නේ පිරිමි බෝධි සත්ව රූප වඳින කට්ටියට. වාමාංශික කියන්නේ බොධිසත්ව ශක්ති ඒ කියන්නෙ කාන්තා පක්ෂයට වැඳුම් පිදුම් කරන කට්ටියට. මූලික වශයෙන් වාමා කියන්නේ කාන්තාවට. ඒ අනුව මේ නම හදගෙන තියෙනව.

එතකොට මම මේකෙන් පෙන්නන්න හැදුවෙ ඇත්තටම දකුණු ඉන්දියාවෙ මහායාන බලය 7 වෙනි ශත වර්ෂය වෙන කොට වෛෂ්ණව සහ ශෛව බලය උග්‍රවීම නිසා නැති වුනු බවයි. නැත්නම් ඉතාමත් දුර්වල වුනා. එහි හිටපු ඉතා දක්ෂ ආචාර්ය වරු විවිධ පළාත්වලට ගියා. සමහරු ලංකාවට ආවා. සමහරු ලංකාව හරහා ජාවාවලට ගිහිල්ල චීනයට ගියා. ඔය ආදී වශයෙන් නොයෙක් ප්‍රදේශවලට ගියා. එතකොට ලංකාවෙ අභයගිරි විහාරය විශේෂයෙන්ම සූදනම් වෙලා හිටියා ඒ වගේ විවිධ බෞද්ධ සම්ප්‍රදායවලට අයිති ආචාර්යවරුන් පිළිගන්න. ඒ වාගේම විරාංකුරාරාමය අභයගිරියෙ තිබ්බව ඉතා මත්ම ප්‍රසිද්ධ බෞද්ධ පිරිවෙනක්, අධ්‍යාපන ආයතනයක්. ඒ කාලයේ විදේශීය භික්ෂූන් වහන්සේලා පවා ඇවිල්ල එහි අධ්‍යාපනය ලබපු බවයි පෙනෙන්නෙ. ලැබිල තියෙන ශිලා ලිපි සාධක අනුව පළවෙනි සේනගෙ කාලයේ පමණ මේ විරාංකුරාරාමය ඉතාමත්ම ජනප්‍රියත්වයට පත් වෙලා තිබුණ බවයි අපට හිතා ගන්න පුළුවන් වෙන්නෙ. මහායාන බලපෑම් ලංකාවේ මේ යුගයට අයිති සමහර ශිලා ලිපිවල තියෙනවා. කුච්චවෙලි ශිලා ලිපිය උදාහරණයක් හැටියට ගත්තොත්. එය ලියලා තියෙන්නේ සංස්කෘත භාෂාවෙන්. එය ලිවීම සඳහා පාවිච්චි කරලා තියෙන අක්ෂර ක්‍රමය පල්ලව ග්‍රන්ථාක්ෂර. මම ඒ අකුරු බලා ගැනීම සඳහා ඉදිරිපත් කරන්නම්. දැන් මේ තියෙන්නෙ ඒ ලිපියේ තියෙන අකුරු ටික.


*Epigraphia Zeylanica* *Vol. III. Plate 12.*



Kuccavēli Rock Inscription

පරණවිතාන මහත්මයා එපිග්‍රැපියා සිලනිකා තුන්වන වෙලුමෙ දීලා තියෙනවා මේ අකුරුවල විස්තරය. එතකොට මෙය ලියලා තියෙන්නේ පල්ලව අකුරුවලින්, සංස්කෘත භාෂාව. සංස්කෘත ලිපියක් ලියන්න බ්‍රාහ්මී අක්ෂර මාලාව කිසිසේත් ප්‍රමාණවත් වෙන්නෙ නැහැ. එතන ඇතිවුනා ගැටළුවක්. ඒ ගැටළුවට පිළියම සොයාගැනීමට අවශ්‍ය වුනු වෙලාවේදී පල්ලව ග්‍රන්ථාක්ෂරවල සියළුම අවශ්‍ය කරන අකුරු තිබුණා. ඒ කියන්නේ මිශ්‍ර සිංහල හෝඩියේ හැටියට අද අපි පිළිගන්න වර්ණ මාලාව පල්ලව වර්ණ මාලාවෙන් ලංකාවට ගන්න හොඳටෝම හැකි බව වැටහුනා. ඒ නිසා සංස්කෘත ලිපි ඉදිරිපත් කිරීමේ දී බ්‍රාහ්මී අක්ෂර පාවිච්චි කරන්නේ නැතිව පල්ලව අක්ෂර පාවිච්චි කරලා තියෙන බව විශේෂයෙන්ම මෙහි දී පෙනී යනවා. දැන් මේ ශිලා ලිපිය පරණවිතාන මහත්මයා හත්වෙනි ශත වර්ෂයට පමණ අයිති එකක් හැටියටයි සලකන්නේ. ඉස්සර ඒ මහත්මයා සඳහන් කරලා තියෙනවා පස්වෙනි ශත වර්ෂයත් අටවෙනි ශතවර්ෂයත් අතර කාලයට අයිතියි කියලා. පසුව ඒ මහත්මයාගෙ වැඩි පිළිගැනීම හත්වෙනි ශතවර්ෂයට අයිති එකක් හැටියටයි. සමහර විට හත්වෙනි ශතවර්ෂයට අයිති නම් මේක හත්වෙනි ශතවර්ෂය අගභාගයට පමණ වෙන්න පුළුවන්. එතකොට මේ අක්ෂර බැලූ බැල්මට පේනවා බ්‍රාහ්මී අක්ෂර සමඟ සංසන්දනය කරන කොට විශාල වෙනසක්. පල්ලව අක්ෂරත්, බ්‍රාහ්මී අක්ෂරත් අතර විශාල වෙනසක් දක්නට ලැබෙනවා. මම පස්සෙදි විස්තර කරන්නම්. පල්ලව අක්ෂරත් ප්‍රභවය වෙලා තියෙන්නේ බ්‍රාහ්මීවලින්. එහෙම ප්‍රභව වෙලා ස්වාධීනව ඒ අකුරුවල හැඩය වර්ධනය වෙලා තියෙනවා. දැන් ඒ වර්ධනය වූ ආකාරය හුඟාක් දුරට අපේ සිංහල අකුරු අටවෙනි ශතවර්ෂයෙන් මෙහා පැත්තට වර්ධනය වෙලා තියෙන ආකාරයත් එක්ක අපිට සංසන්දනය කරන්න පුළුවන්. සාමානයෙන් 11 වන ශතවර්ෂයේ දී තිබුනේ කොහොමද කියලා බලා ගන්නට පුළුවනි. දැන් පනාකඩුව තඹ සන්නස ඒකේ තියෙන අකුරුයි ඒ වගේම ජේතවනාරාම කැණීම්වලින් හමුවෙලා තියෙන රන්පතේ අකුරුයි ඒ වගේම මාල දිවයිනේ ඒ කාලේ පාවිච්චි වූ අකුරුත් සමානයි. අර කියපු නිදර්ශන තුනේම අකුරු පල්ලව අකුරුවලින් ප්‍රභව වුනු බවයි පෙනී යන්නේ.

දැන් එතකොට සිංහල අකුරුයි, පල්ලව අකුරුයි අතර තිබෙන සම්බන්ධය මොකක්ද? කිට්ටු සම්බන්ධයක් තියෙනවාද? කියලා බලමු. මේ චාට් එකේ පෙන්නුම කරනවා පල්ලව අකුරු සහ සිංහල අකුරු අතර තියෙන සමානත්වය.



දැන් මේ එක්කම අපි සංසන්දනය කෙරුවොත් බ්‍රහ්මී අකුරුත් එක්ක සිංහල අකුරු වඩා ලංවන්නේ පල්ලව අකුරුවලට මිස බ්‍රාහ්මී අකුරුවලට නෙමෙයි. පල්ලව අකුරුවල ආභාෂයෙන් හත්වෙනි ශතවර්ෂයේ දී බ්‍රාහ්මී යුගය ඉවර වෙනවාත් එක්කම රටේ ඇතිවුනු දේශපාලන විපර්යාසයත්, විශේෂයෙන්ම පල්ලව සංස්කෘතියේ බලපෑමත් හේතු කොට ගෙන ලිවීමෙ ක්‍රමය නැත්නම් අක්ෂර මාලාව වෙනස් වුනු බවයි අපට සිතාගන්න පුළුවන් වෙන්නේ. පසුව මම විස්තර කරන්නම් පිල්ලම් ගැන. පිල්ලම් ගැන විස්තර කරනකොට තමයි මෙය වඩාත් පැහැදිලි වෙන්නේ. බ්‍රාහ්මී අක්ෂරවල පිල්ලම් ක්‍රමයට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් පිල්ලම් ක්‍රමයක් සිංහල අකුරුවල තියෙන්නෙ. ඒ වගේම සිංහල අකුරුවල තියෙන පිල්ලම් ක්‍රමය ඒ විදිහටම තියෙනවා පල්ලව අකුරුවල. 'අ' කොච්චර වෙනස් ද? ග්‍රන්ථාක්ෂර 'අ' යන්න දැන් සිංහල 'අ' යන්නට ඉතාමත්ම ළඟයි. අර උඩට යන ඉරේ ගැටය විතරයි අඩුවෙලා තියෙන්නේ. ඊළඟට **'ක'** යන්න ඉතාමත්ම සමානයි. බ්‍රාහ්මී අක්ෂරවල තියෙන **'ක'** යන්නත් මෙයට සමානයි. පල්ලව ග්‍රන්ථාක්ෂරවල මෙයට වඩා ටිකක් හැඩයෙන් යුක්ත **'ක'** යන්නක් ඉදිරිපත් වෙලා තියෙනවා. ඒ කියන්නෙ සිංහල 'ක' යන්න හුඟක් දුරට ලංවෙන විදිහේ **'ක'** යන්නක් තියෙනවා. මේ රූපයේත් තියෙනවා. දැන් **'ජ'** උදාහරණයක් හැටියට අරගෙන බලන්න. ඉතාමත්ම සුළු වෙනසයි තියේන්නේ. දැන් මම කිව්වා පිල්ලම් පිළිබඳව. දැන් ද කියලා ලියනකොට, **'තා'** කියන එක, මේක සිංහල **'ත'** යන්නක්. මේක පල්ලව **'ත'** යන්නක්. දැන් **'තා'** ලියන්නේ ඇලපිල්ල පිල්ලම් කියන කොට 'අ' යනු කී අයන්නේ ඇලපිල්ල ලියාලූයෙන් ආයන්න' ඒ විදිහටනේ කියන්නේ. එතකොට ඒ පිල්ලම් කියලා කියන්නේ, **ආ, ඉ, ඊ, උ, ඌ** වාගේ ස්වර වෙනුවට පාවිච්චි කරන සංකේත. මම විශේෂයෙන් ම පෙන්වන්නම්, **'උ'** කීප විදිහකට පාවිච්චි කරපු හැටි. ඒ කියන්නේ දැන් අපි **'න'** ලියලා **'න'** යන්නට පාපිල්ල ලියන්නේ එක ක්‍රමයකට **'නු'** කියලා ශබ්ද කිරීමට. නමුත් **'ත'** ලියලා ඒකට පාපිල්ල ලියන්නෙ **'තු'** කියලා තවත් ක්‍රමයකට. ඒ ක්‍රම දෙකම තියෙනවා පල්ලව අකුරුවල. ඊළඟට ඉස්පිල්ල ලියලා ගැටේ ගැහිල්ල, ඉතාමත්ම පැහැදිලිව පල්ලව අකුරුවල තියෙනවා. මේ තියෙන්නේ **'නී'** ඊළඟට **'ප්‍ර'** කියන එක, පල්ලව අක්ෂරවලත් ඒ විදිහටමයි. වෙනසක් නැහැ.

බ්‍රාහ්මී අක්ෂර මාලාවේ ඔය පිල්ලම් දක්වලා තියෙන්නේ වෙනත් විධියකටයි. දැන් **'පා'** පෙන්වන්න ඕන උනහම චමේ සිට දකුණට තිරස් කෙටි ඉරක් අකුරට එක්කරනවා මේ විදියට ɛ = පා

එතකොට ග්‍රන්ථාක්ෂරවල අපි සිංහලෙන් පාවිච්චි කරන ඇලපිල්ල පාවිච්චි කරනවා. දැන් බ්‍රාහ්මීවල ඉස්පිල්ල දක්වන්නේ මේ විදිහටයි : ξ = පි ග්‍රන්ථාක්ෂරවලයි, සිංහලවලයි ∩ මේ විදිහේ එකක්. **'පු'** මේ විදිහටයි බ්‍රාහ්මී අක්ෂරවල තියෙන්නේ : ψ නමුත් සිංහල සහ පල්ලව ග්‍රන්ථාක්ෂරවල වෙනස් : **පු**. එතකොට සංසන්දනය කරපුවහම බලා ගන්න පුළුවන් කොයි එකද මේ සිංහල අකුරුවලට ලංවෙලා තියෙන්නේ කියල. ඊළඟට 'වෙ' වෙනුවට බ්‍රහ්මීවල යොදන පිල්ලම මෙසේයි : ψ කො ලියනකොට මේ විදියට ලියනව ∓ මෙය සම්පූර්ණයෙන්ම සිංහල ක්‍රමයට වෙනස් ක්‍රමයක්.

සිංහල අක්ෂරමාලාව පිළිබඳ පර්යේෂණ පැවත්වූ පඬිවරුන් රාශියක් ඉන්නවා. හැම කෙනෙකුගේම අවධානය යොමු වුනේ වර්ණවල ප්‍රධාන රූපවල විකාශය පිළිබඳව කථා කිරීමටයි. පිල්ලම් පිළිබඳව අවධානය යොමු වී නැති බවයි පෙනී යන්නේ. **එතකොට සිංහල අක්ෂර මාලාව බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් කෙලින්ම ප්‍රභව වෙච්ච එකක් නෙවෙයි. පල්ලව ග්‍රන්ථාක්ෂරවලින් ඒ කියන්නේ හත්වෙනි, අටවෙනි ශතවර්ෂ වල තිබුණු පල්ලව ග්‍රන්ථාක්ෂරවලින් නිර්මාණය වෙච්ච එකක් කියන අදහසයි ඇත්ත වශයෙන්ම මෙයින් අපට වටහා ගන්න පුළුවන් වෙන්නෙ.**

දැන් සීගිරි කුරුටු ගී ලියලා තියෙන අකුරු අරගෙන බැලුවොත් මේ සීගිරි අකුරුයි දැන් අපි පාවිච්චි කරන සිංහල අකුරුයි සංසන්දනය වෙනවා. දැන් මේ අකුරු වැඩි වශයෙන් ලං වෙන්නේ බ්‍රාහ්මී අකුරුවලට නෙවෙයි, පල්ලව අකුරුවලටයි. **'ක'** යන්න හුඟාක් දුරට සමානයි. **'ක'** යන්න විතරක් නෙවෙයි, හුඟක් අකුරු මම හිතන්නේ සියයට අනූවක් විතරම සමානයි. සීගිරි කුරුටු ගීවල අක්ෂර මාලාව, අක්ෂර රූපවල හැඩය සමාන වෙන්නේ පල්ලව අක්ෂරවලට මිස බ්‍රාහ්මී අක්ෂරවලට නෙවෙයි.

දැන් අපේ මිශ්‍ර සිංහල හෝඩිය සහ ශුද්ධ සිංහල හෝඩිය කියලා හෝඩි දෙකක් තියෙනවා. ශුද්ධ සිංහල හෝඩිය පාවිච්චි කරන්න බැහැ සංස්කෘත ලියවිල්ලක් ලියන්න. සංස්කෘත හෝ සංස්කෘත මිශ්‍ර සිංහල ලිවීම සඳහා මිශ්‍ර සිංහල හෝඩිය අවශ්‍යයි. එතකොට ඒ මිශ්‍ර සිංහල හෝඩියට ශුද්ධ සිංහල හෝඩියේ නැති අකුරු ගණනාවක් එකතු වෙලා තියෙනවා. දැන් අපි සාමාන්‍යයෙන් උදාහරණයක් විතරක් අරගෙන බලමු. **ෂෘ**කාරය, පල්ලව අක්ෂර රූපයමයි. වර්තමාන පල්ලව අකුරුයි, සිංහල අකුරුයි සංසන්දනය වෙනවා එක්තරා ප්‍රමාණයකට. පල්ලව අකුරු ද්‍රවිඩ අකුරුවල හැඩයට වෙනස් වෙලා ගිහිල්ලා තියෙනවා. නමුත් මූලික ලක්ෂණ හුඟාක් දුරට සමානයි, සිංහල අකුරුත් එක්ක. දැන් උදාහරණයක් හැටියට **'ච'** අරගෙන බැලුවොත් වෙනසකට තියෙන්නේ උඩට ඇවිල්ලා තියෙන එක විතරයි. එතකොට **'ජ'** කියන එකත් ඉරි කැල්ල නැති එක විතරයි, අඩුවකට තියෙන්නේ. ඒ වගේ සාමානතා විශාල සංඛ්‍යාවක් තියෙනවා. එතකොට දැන් මෙන්න මේ අකුරු **ෂෘ**කාරය සියයට සියයක් සමානයි. පල්ලවව ර්තමාන **ෂෘ** කාරය ඒ. තවත් **ෂෘ**කාරය තනිකර ගත්තායින් පස්සෙදී සිංහල එකයි, පල්ලව එකයි සමානයි.

මෙතෙක් මම උත්සාහ කලේ හත්වෙනි ශතවර්ෂයේදී හිටි හැටියේම ලංකාවේ ශතවර්ෂ 9ක් තරම් දීර්ඝ කාලයක් තිස්සේ පාවිච්චි කළ වර්ණ මාලාව වෙනස් කරලා අළුත් රටාවකට ලියන්න පටන් ගත්තේ ඇයි? කියන ප්‍රශ්නයට

පිළිතුරු සැපයීමට එතන දි අපි පෙන්නලා දුන්නා පල්ලව රාජ්‍යයත් එක්ක ලංකාව තිබ්බ්ච සම්බන්ධකම්, දේශ පාලන සම්බන්ධකම්, ඒ වාගේම සංස්කෘතික සම්බන්ධකම් උඩ හත්වන ශත වර්ෂයේ අග භාගයේ ඉඳලා ඒ කියන්නේ ක්‍රි.ව. 660 දී පමණ ඉඳලා පල්ලව දේශය සමහ ලංකාව සම්බන්ධකම් පවත්වලා තියෙනවා. අවුරුදු 20ක් පමණ මාන කුමාරයා පල්ලව රාජ්‍යයේ හිටියා. ඔහුගේ පුත්තු තුන්දෙනා පල්ලව රාජ්‍යයේ හැදුනා, වැඩුනා. ඒ ගොල්ලෝ ලංකාවට ආවයින් පස්සෙදී ඇත්ත වශයෙන් ම කල්පනා කරන්න ඇති, ලංකාවේ එවකට තිබ්බ්ච බ්‍රාහ්මී අක්ෂරමාලාව ප්‍රමාණවත් නැහැ. ඊට වඩා සම්පූර්ණ වර්ණ මාලාවක් ලංකාවේ ලිවීම සඳහා අපි ඉදිරිපත් කරන්න ඕන කියල. ඒ නිසා ග්‍රන්ථාක්ෂර එක්ක අළුත් වර්ණ රාශියක් සිංහල හෝඩියට එකතුවෙලා තිබෙනවා. එතකොට එක පැත්තකින් බැලුවම අක්ෂර රූපවල හැඩය, අනෙක් පැත්තෙන් බලපුවම පස්සෙදි වර්ණ සංඛ්‍යාව කියන මේ දෙකම සංවර්ධනය වෙලා තියෙනවා. මිශ්‍ර සිංහල හෝඩියක අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට මානවම්ම පරම්පරාවෙන් විශාල සේවයක් සිදුවුනු බව මෙයින් ඔප්පු වෙනව. එතකොට අපිට අවසාන වශයෙන් කියන්නට පුළුවනි **වර්තමානයේ අප පාවිච්චි කරන වර්ණ මාලාව කෙලින්ම බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් ප්‍රභවය ලැබූ එකක් නෙවෙයි. බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් පල්ලව අක්ෂර මාලාවත්, පල්ලව අක්ෂර මාලාවෙන් සිංහල අක්ෂර මාලාවත් බිහිවෙලා තියෙනවයි කියන එක.** එතකොට ලංකාවේ ඉඳලා මාල දිවයිනට ගියපු අය, මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාගේ **සිංහල ලේඛන ව්‍යාකරණය** කියන පොතේ මේක පෙන්වලා තියෙනවා, 11 වෙනි ශතවර්ෂයේදී මාල දිවයිනේ පාවිච්චි වෙලා තියෙන්නේ මේ වර්ණ මාලාවයි. එතකොට ලංකාවෙන් මාල දිවයිනට ගියපු අය, නැත්නම් ලංකාවේ ආධිපත්‍යය පිළිගෙන තිබුණු අවස්ථාවකදී ඒ රටට සිංහල අක්ෂර ගියා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ආගමික, බෞද්ධ සම්බන්ධය උඩ මේ වර්ණ මාලාව මාල දිවයිනට හඳුන්වා දුන්නා වෙන්නත් පුළුවන්.

(ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී 1990.07.26 දින පවත්වන ලද **ජාතික පුස්තකාල දේශන මාලා අංක 02** ඇසුරෙන් සකස් කරන ලද්දකි.)

# Conservation and Preservation of Library Materials in Sri Lanka

*By*

**Mrs. Ishvari Corea**
*Chairperson,*

**Mrs. D. M. Thilakaratne**
*Asistant Librarian,*
*Sri Lanka National Library Services Board,*

**Preamble**

The National Library of Sri Lanka is the centre round which the full information and library needs rotate.

We should not forget the concept that the National Library should safeguard the heritage of the nation as the heritage represents the life and culture of the people both literary and artistic.

It is also binding on the National Library to retain and preserve for posterity and make available to the public all informaton needed for research, planning and policy making, to acquire and conserve a comprehensive national collection of publications produced in Sri Lanka. and function as a legal deposit library, and to acquire and preserve manuscripts and other library materials such as Microfilms, Photocopies, Rare books and Ola leaf manuscripts.

While librarians, archivists and many others are well aware of the need for preservation and conservation, it is a theme that still needs repeating. Preservation is essential to the preservations of knowledge. Preser vation and conservation activity is well established in UK, the USA, Canada, USSR, etc,. but not in the developing countries such as ours. Therefore this conference is indeed very timely. The organisers should be lauded for their efforts and we could learn much from the deliberations during this period. This is an indication of the growing strength of cooperative efforts. The problems of library materials in our region are more or less similar. we are concerned also with disasters most natural disasters relate to fire, floods, earthquakes, volcanoes etc. Fortunately in Sri Lanka we have had really to contend so far only with man made, disasters and problems arising out of a tropical climate. Libraries have been destroyed from time immemorial due to enemy activity, religious disturbances, etc.

Conferences such as these are an important way to disseminate and exchange knowledge. The preservation and conservation of non book materials are also very important. It must be mentioned that funding is vital to any preservation efforts.

Attention is being focussed to the problem of using acidic paper in publishing the use of alkaline printing paper is essential. Until mass deacidification is more generally practised, reformatting will remain as the principal way to save the content of materials.

The preservation and conservation of the National Collection is of vital importance. Towards this end the Library Services Board is spending much time and money. Fortunately the ola leaf manuscripts are in good condition as they are being treated in the traditional manner. Unless they come into contact with water or fire they can be preserved without much trouble.

Library materials contain a variety of material of which most are organic and so they are subject to deterioration. Deterioration can become a process that cannot be halted unless adequate and timely care is taken.

Librarians are faced with numberous problems in preserving the collections under their custody. Any material or records that are brought to the library can bring with them various problems which would need immediate attention. This care is more needed for rare, used and old books.

**Preservation Awareness and Training in Sri Lanka**

One of the major problems faced by the libraries today is the conservation of the human knowledge stored in both traditional as well as modern media. Conservation has been until recently identified as a pure technical activity confined to a back room in the library. It is encouraging to note that this attitude is now being treated as outdated and librarians are paying more attention to create an awareness among their colleagues and clients on the careful handling and use of material so that considerable savings can be effected in the heavy financial allocations set aside for conservation of library material.

Conservation of information resources is not a new phenomenon in Sri Lanka. The Buddhist temples and the pirivenas that functioned as seats of learning and repositories of knowledge were in possession of advanced

knowledge and techniques for the conservation of the written word. The preparation of the ola leaf for writing and the final processing of the written word into a long lasting book was an art which demanded special skills. Apart from the technical skills involved in this process, considerable attention was paid to develop and shape the attitudes of library keepers and users on the importance of proper maintenance and careful handling of material. A strong awareness on conservation of material was built up in both clergy and lay students which was handeddownfrom generation to generation. The book had become a very common feature of the day to day life of children who are taught to regard the books as a teacher. Even today it is not an uncommon sight in rural Sri Lanka to see a child paying homage to the text book before it is put aside after a study session.

However, the introduction of the throw-away type reading material such as cartoon papers, cheap novels and light reading material aimed at various interest groups, have had a considerable influence on the attitudes towards reading material. The younger generation, especially children living in urban areas have easy access to these material which can be thrown into the dustbin after reading. Ample evidence of such attitudes can be gathered by scanning bookshelves in any urban public library in the country.

**Conservation Awareness Programme :**

Although conservation has become a subject of serious attention of the professionals, no significant steps have yet been taken at the national level to create a conservation awareness. The long felt need for a national body which could take the leadership in conservation aware ness was fulfilled at the beginning of this year with the opening of the National Library of Sri Lanka.

There have been some attempts by individua organizations and professional bodies in creating an awareness on conservation of library mateirals. Almost all these programmes were confined to the training of librarians and students of library science. Professional educational activities carried out by the Sri Lanka National Library Services Board and the Sri Lanka Library Association have contributed a great deal in promoting conservation awareness among the librarians and library science students.

**Sri Lanka National Library Services Board :**

Even at the present moment this Board conducts several courses of study and orientation courses as well as workshops and seminars for the benefit of librarians of small libraries in the country. The Board is also conducting a correspondence course for librarians serving in rural areas away from Colombo, who are unable to attend the library science courses conducted by the Sri Lanka Library Association or the University of Kelaniya. Conservation and preservation of material have been identified as a significant component of these courses. In designing the courses due attention has been paid to the fact that the librarians serving especially in tropical countries should have adequate knowledge of the effects of climatic conditions, humidity, insects and other causes of damage to books. Steps have already been taken to establish a conservation centre and a bindery at the National Library which could serve as a workroom as well as a training workshop on the conservation of material.

**Sri Lanka Library Association :**

The Sri Lanka Library Association commenced its educational activities in 1960 & is responsible for producing the majority of the professional manpower employed in libraries in the country. The professional courses conducted by this Association leading to the associateship consists of three parts. i.e. First Examination, Intermediate Examination and the Final Examination. The courses duration is over 144 hours and about 8% of this time is devoted to the conservation and preservation of library material. Apart from the academic component, the students are required to undergo practical training in a library which includes a component on the problems of conservation.

However, since the designing of inservice programmes are done by the respective libraries, the quality and scope of training given mainly depend on the capacity and the efficiency of the respective libraries.

**Univeristy of Kelaniya**

There courses are conducted by the University of Kelaniya. The post-graduate diploma in Library and Information Science is an advanced full time course for graduate librarians who have completed a specified number of years in a senior capacity. The other two are part time courses aimed at working librarians in junior positions. All these courses have identified conservation as a significant component in their curricula.

**National Archives Department**

Being the premier institution specialised in the country for conservation of materials, the department has a well equippd bindery and a repair section equipped with sophisticated machinery and tools which can handle even complicated repair work. It falso as the trained manpower which can be utilized for the deve-

lopment of conservation awareness in the country. Provision of inservice training for librarians and binders on request is one of its services. With the introduction of the mobile ministry system, departments and corporations under the ministries are required to provide their services in places where the mobile ministry is held. Under this system the departments and corporations have been able to expand their services to rural folk who under normal circumstances do not receive such services. This programme is a very good opportunity for organizations including libraries to carry the message of conservation to the doorstep of the general public.

**The Need for a Dynamic Conservation Awareness Programme**

As described above the existing conservation awareness programmes available in the country are strictly confined to the professional education sector. It is imperative that the awareness of conservation of information resources be disseminated to the general public especially to the school going population. Although no research findings are available, it is evident that most library books and other media are damaged by readers who are not either considerate or aware of how to handle delicate material. It is highly unlikely that the damages to books, etc., by careless handling will persist if the readers could be influenced by a methodical conservation awareness programme. There is no doubt that such an influence would immensely help develop the attitudes of readers which would lead to massive savings of funds including foreign exchange spent for conservation of material.

Conservation awareness on the part of readers would also help the libraries in locating the books which need attention. On many occassions damages caused by insects, mildew, or even polluted air go unnoticed at the initial stages as the librarians cannot be vigilent of their holdings all the time. Often these types of damages are noticed by junior library employees and/or readers. Therefore most of the damags can be detected in an early stage if the readers could be alerted to the consequences of these undesirable and disasterous occurrence.

Apart from the environmental factors, economic factors also play a vital role in the conservation activities undertaken by libraries. Today conservationsts are faced with a series of problems created by publications printed on low quality paper, or with poor quality ink.

The new meida introduced by technologicl innovations have introduced new dimensions to the conservation awareness programme of the country. Micro productions and audiovisual maeterial are now widely used in libraries in the country. Many major libraries including those of the University of Peradeniya and the National Institute of Education are now resorting to micro reprography with a view to easing the accommodation problems and resource sharing expenses. etc. Digital technology has also made it s presence in libraries through magnetic diskettes which are being used to exchange computer produced data files. Compact disk technology is being introduced to several libraries including those of National Acquatic Resources Authority. The British Council and the National Institute of Education. This material is very delicate and could get easily damaged by careless handling. Unlike printed matter, damages caused to these materials cannot be readily detected and therefore special care has to be taken for their preservation and conservation. It is imperative that both users and library staff should be properly exposed to the conservation problems involving these materials so that they will take adequate care in handling such delicate materials.

**Strategies for the Promotion of Conservation Awareness**

The National Library of Sri Lanka can play the leading role in the conservation awareness programme in the country. As the institution which provides leadership to the island's library system it is the responsibility of the national library to promote conservation awareness through its educational and training programmes. Since the National library is responsible for the training of teacher-librarians of the country it will not be a difficult task to convey the conservation message to the tudent population through teacher librarians.

Non Governmental organizations such as learned societies, non-formal education centres and various voluntary organizations have a very high potential in promoting conservation awareness in the country under the leadership of the National Library.

**Preventive Programme**

It is essential to have well thought out preventive programmes. It is better to take quick action in restoration, But unfortunately the librarians in our country do not have much knowledge of how to preserve and conserve. Though preservation and conservation is included in the teaching programmes of library science in the country, a well thought out and inexpensive methodology is necessary. Much damage

can be done to library materials by untrained librarians by using sensitive tapes to repair torn pages of books; use of highly acid paper to wrap books in order to protect them from dust, wrong repair methods and bad storage.

No routine or regular checks are carried out in our country for isect or other enemies library material. It is necessary to exercise regular checks so that preventive measures could be taken to halt the damage that can be irreparable at the commencement of the deterioration.

Readers too should be advised as to how to handle books and other materials as carelessness can lead to the damaging of books, and other library materials.

A problem faced by the librarians in a tropical country is the preservation of library material against a polluted environment. Our library materials are stored in rooms which are damp, hot or cold or dry and are subject to variable weather conditions. Cities are polluted with carbon dioxide, sulpher dioxide, ammonia, etc. The exposure to light, especially ultra violet radiation can be very serious. Heat also promotes deterioration of library materials. The higher the temperature, the faster the library materials will deteriorate. Extensive heat can dry the material and embrittlement can set in which could result in warping. Leather binding can warp and paper can become brittle. Moisture is also very bad for library materials.

**Pilot Project**

The National Library Services Board is deeply concerned with the preservation of collections. It intends to carry out a pilot project or survey to assess methods and procedures that would be necessary.

**Evaluation**

Evaluation can be done by a questionnaire. The surveyor can identify the place and date of publication, the physical nature and the conditions of the volumes sampled, eg. the binding condition and strength of the inner part of the volume. Checks also should be made to see whetehr any obvious physical characteristics of the volumes being checked would preclude microfilming as a preservation option. Other options available would be rebinding and repair.

Data on the date and palce of publications would give a profile of the age and source of the collection which would help in the preservation.

Brittle or weak paper can pose serious problems in preservation. Checks should be made to see the internal condition of the publications whether pages are damaged leaf attachments broken, etc.

Increased use of acid free paper and a mass deacidification programme are necessary for the preservation of library materials.

The need for extensive conservation treatment tncluding deacidification, leaf repair, and strengthening, fine binding and custom box making is more difficult to quantify in terms of treatment time per volume.

Protective enclosures are useful for deteriorated items that cannot be treated immediately.

The preservation problem is a large one, for any one institution to solve. It should therefore be a cooperative endeavour if it is to suceed. It is also important to give shape and direction to cooperative efforts. Preservation signifies all protective measures that help to reduce the rate of deterioration of material.

Bibliographic records of materials that have been microfilmed should be prepared and be made available so that other institutions could have access to them and identify what has been filmed so than duplication of efforts could be avoided.

**Identifying Priorities**

Libraries should be requested to identify their priorities for conservation and preservation. As no library material is safe from light, heat and moisture and from the impurities in the air, attention towards the protection of materials becomes more important thanrepairing.

Air conditioning though expensive is most effective in controlling biological and chemical enemies.

The Sri Lanka National Library Services Board is the focal point for research on library techniques. It is concerned with planning policy guide lines for adoption in the field of information technology; designing training courses for library personnel who would be competent in handling modern information techniques, conservation and preservation methodology, etc.

**Central Authority**

The Board can act as the Central Authority in the preservation and conservation of library materials.

With the devolution of power from the centre to the periphery the provincial councils will have to play an important role in the functioning of libraries. Fortunately the National Library Services Board in its advisory capacity can influence these councils in the proper setting up of libraries and their control. The Board is in the process of preparing guidelines for the formation of an Authority which will provide technical support for the proposed provincial libraries, promote cooperation between libraries, institutions, etc. This Central Authority will not only co-ordinate but help to set up plans and monitor the services and activities with regard to preservation and conservation of all library materials.

# ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගැටළු සහ ප්‍රවනතා

සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන් සමාගමේ ප්‍රකාශන කළමනාකාර

**හෙන්රි සමරනායක මහතා විසිනි**

ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශනය පිළිබඳ දේශනයක් පැවැත්වීමට මට ඇරයුම් කලේ පුස්තකාල සේවා මණ්ඩලයේ වැඩ බලන අධ්‍යක්ෂ උපාලි අමරසිරි මහතායි. ඒ පිළිබඳව මම පලමු කොට අමරසිරි මහතාට ස්තුතිවන්ත වෙනවා. ඒ මහතාගේ යෝජනාව අනුමත කිරීම පිළිබඳව මණ්ඩලයේ සභාපතිනි ඊශ්වරී කොරයා මහත්මියට ද ස්තුතිවන්ත විය යුතුයි. මේ දේශනය ගැන වැඩිදුරට විමසීමේ දී අමරසිරි මහතා මට කියා සිටියේ පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ අංශ පිළිබඳව පුස්තකාල සේවා මණ්ඩලය සංවිධානය කරන මාසික දේශනමාලාවේ එක් දේශනයක් ලෙස මෙය සැලකෙන බවයි. පුස්තකාල සේවාව, සාහිත්‍යය, පොතපත ප්‍රකාශනය වැනි කරුණු අරබයා මාසික දේශනමාලා පැවැත්වීමට එළඹීම ගැනද මණ්ඩලයේ වත්මන් සභාපතිනියට හා වැඩ බලන අධ්‍යක්ෂවරයාට අපගේ ස්තුතිය හිමි විය යුතුයි. එහෙත් මා වෙත පැවැරූ මේ වගකීම මා භාර ගත්තේ මදක් පැකිලීමකින් යුතුවයි. එයට එක් හේතුවක් මෙවැනි දේශනයක් කිරීමට තරම් මම මේ ක්ෂේත්‍රයේ ප්‍රවීනයෙක් ද යන්න ගැන මා තුළ ඇති වූ සැකයත් අනෙක් අතට පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ නියුතු අපි හොඳ දේශකයන් වත් හොඳ කථිකයන්වත් නොවෙයි. මම හැමවිටකම කියන පරිදි අපි මුද්‍රණකරුවාත් ලේඛකයාත් අතර සිටින අතර මැදියෙක්. මම මේ අතරමැදියයෙක් කියලා මෙතනදී කියන්නෙ සාමාන්‍යයෙන් යෙදෙන සුලභ අර්ථයෙන් නොවෙයි. එහෙත් පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයට නිහඬ සේවයක් කරන ප්‍රකාශකයා කථාවට වඩා දක්ෂ කියවීමටයි. දක්ෂ විය යුත්තේත් කියවීමටයි. මම හිතන හැටියට විවිධ අවස්ථාවලදී විවිධ ආකාරයෙන් කියවීම පුරුද්දක් කොටගෙන සිටින හෙයින් මම මේ දේශනය ද කොලය බලා කියවීමට තීරණය කලා.

පුස්තකාල සේවා මණ්ඩලයේ යෝජනාව මත විසි එක්වැනි සියවසට පා තබන ප්‍රකාශන කර්මාන්තය හෝ 'ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තයේ ගැටළු සහ ප්‍රවනතා' යන මාතෘකා දෙකෙන් එකක් තෝරා ගැනීමට මට සිදු වුනා. විසි එක්වෙනි ශතවර්ෂයට යාමට පෙර, විසිවෙනි ශතවර්ෂයේ වුවද දහ නමවෙනි ශතවර්ෂයේ පැවැති තත්ත්වයේම පවතින වත්මන් ශ්‍රී ලංකාවේ ප්‍රකාශනය ගැන කථා කිරීමට මම අදහස් කළා. ඒ නිසා මම තෝරා ගත්තේ දෙවන මාතෘකාව.

ආරම්භයේදීම පොත් ප්‍රකාශනය යනු කුමක් ද යන්න පැහැදිලි කිරිම මැනැවැයි මට හිතෙනවා. බොහෝ පොත්වල අවසාන පිටුවේ අග භාගයේ මෙසේ සඳහන් වෙනවා. අසවල් ස්ථානයේ පදිංචි අසවල් පුද්ගලයා විසින් අසවල් මුද්‍රණාලයේදී මුද්‍රණය කරවා ප්‍රකාශ කරන ලදි. අප ආයතනයේ ප්‍රකාශිත පොත්වල බොහෝ විට මෙසේ සඳහන් වෙනවා. බොහෝවිට කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ, අංක 41 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම මඟින්, කොළඹ 02 ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ, අංක 41 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ලේක්හවුස් ප්‍රින්ටර්ස් සහ පබ්ලිෂර්ස් සමාගම මඟින් මුද්‍රණය කරවා ප්‍රකාශ කරන ලදි. පොතේ මුල් පිටුවේ හෝ මුල් පිටුවේ හා කවරයේ කතුවරයාගේ නම සඳහන් වෙනවා. ඊට අමතරව ප්‍රකාශකගේ හෝ ප්‍රකාශනයට පත් කරන ආයතනයේ හෝ නම සහ ලිපිනය සඳහන් විය යුතුයි. මා ඉහත සඳහන් කල වාක්‍යයේ මුද්‍රණාල යේ නම ද, එකී පොත මුද්‍රණාලයේ මුද්‍රණය කළ තැනැත්තාගේ නම ද සඳහන් වෙනවා. එයින් හැඟී යන්නේ පාඨකයා අතට පොතක් පත් කිරීමට ප්‍රධාන කොට පුද්ගලයන් තිදෙනෙකුගේ සහාය අවශ්‍ය වන බවයි. ඒ අතර කතුවරයාගේ කාර්යභාරය ද, මුද්‍රණකරුවාගේ කාර්යභාරය ද කුමක් ද යන්න අමුතුවෙන් සඳහන් කළ යුතු වන්නේ නැහැ. නමුත් පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ ප්‍රකාශකයාගේ කාර්යභාරය කුමක් ද? මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කිරීම පමණක් ද? මේ පිළිබඳව පැහැදිලි වැටහීමක් අප අතර නැති බව මේ පිළිබඳව බොහෝ අය සමඟ කළ කථාබහේ දී මට ඒත්තු ගොස් තිබෙනවා. බොහෝ කතුවරුන් ද, පුස්තකාලයාධිපතිවරුන් ද, සමහර ප්‍රකාශයන්ද ප්‍රකාශකයාගේ කාර්යභාරය මැනවින් වටහාගෙන ඇති බව පෙනෙන්නේ නැහැ. ඒකට හේතු රාශියක් තිබෙනවා. ඒ අතරින් ප්‍රධානම හේතුව හැටියට මම දකින්නේ මුද්‍රණාල අයිතිකරුවන් ම ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශනයට පිවිසි තිබීමයි. ඒක වෙන්නේ ඉතාම සිත්ගන්නා සුළු අයුරින්. පොතක් ලියාගත්ත ලේඛකයෙක් අත් පිටපතත් රැගෙන මුද්‍රණාලයකට ගියායින් පස්සේ එයා කියනවා, මේ පොත මට ගහන්නට ඕනා, එකවර සල්ලි දෙන්න නම් ක්‍රමයක් නැහැ. එහෙම නැත්නම් වෙනත් මොනවා හරි හේතුවක් එයා ඉදිරිපත් කරනවා. එහෙම අවස්ථාවක දී මුද්‍රණාල අයිතිකරු කියන්නේ, එහෙනම් අපි ඒ පොත ගහමු. මම විකුණලා කියක් හරි එන ගානක් දෙන්නම්. එතකොට කර්තෘ කියනවා, ඔය කියක් නමුත් මට කමක් නැහැ. මට ඕනෑ ඒක කොහොම හරි ගහලා මගේ අදහස් පාඨකයා අතට පත් කරන්න. එතකොට පොත භාර දීලා යනවා. පොත ගහනවා. මුද්‍රණකාරයා ප්‍රකාශකයා බවට පත්වෙනවා ඉබේම. මොකද එයාගේ නමත් ගහනවා ප්‍රකාශක කියලා. අන්තිමට අර ලේඛකයා කිය කියා ඇවිදිනවා පහු කාලෙකදි, මගේ පොත අහවලාට දුන්නා, නැත්නම් සමරනායකට දුන්නා. පොත් දහදහස් විතර ගහන්න ඇති. මට ලැබුනේ රුපියල් දෙසිය පනහයි, නැත්නම් රුපියල් තුන්සීයයයි. බොහෝ විට ගිය ගිය වේලාවට රුපියල් දෙසිය පනහක් රුපියල් තුන්සියයක් දෙනවා. නැත්නම් තුණ්ඩු කෑල්ලක් දෙනවා කැෂියර්ගෙන් රුපියල් දෙසිය පනහක් ගන්න කියලා. අන්න ඒ විදිහෙන් තමයි පටන් ගැනුනේ. ලංකාවේ ඒ නිසාම බොහෝ මුද්‍රණාල හැඳින්වෙන්නේ මුද්‍රණකරුවෝ සහ ප්‍රකාශකයෝ යනුවෙන්. මේක අද ඊයේදී සිදු වුනු දෙයක් නොවෙයි. සිංහල බෞද්ධ පොතපත ප්‍රකාශනය සඳහා යොමු වූ ප්‍රථම ප්‍රකාශකයාද ලෝකෝපකාර යන්ත්‍රාලය. මම හිතන හැටියට ලංකාවේ සිංහල පොත් ගහන්න මුලින්ම පටන් ගත්තේ ලෝකෝපකාර

යන්ත්‍රාලය. මුල් භාගයේ දී පොත් ප්‍රකාශන කාර්යයේ නියැලුනු බොහෝ ආයතන ප්‍රකාශන යන නම පවා භාවිතා කළේ නැහැ. නිදසුනක් වශයෙන් විසිවෙනි ශතවර්ෂයේ පළමු දශක තුන තුළ ලේක්හවුස් ආයතනය මගින් ප්‍රකාශයට පත් කළ පොත්වල ප්‍රකාශකයා වෙනුවට සඳහන් වූයේ දිනමිණ යන්ත්‍රාලය යන්නයි. දිනමිණ යන්ත්‍රාලයේ මුද්‍රාපිතයි. නැත හොත් ඉංග්‍රීසි පොත්වල ප්‍රින්ටඩ් ඇට් ලේක්හවුස් ප්‍රින්ටින් ප්‍රෙස් යනුවෙන් සඳහන් වී ඇත. මෙම ප්‍රවනතාව ශ්‍රී ලංකාවට පමණක් සීමා වූවක් නොවේ. බටහිර රටවල ඉතා විශාල ප්‍රකාශන ආයතන ද ඒ අයුරින් ම ආරම්භවූ ඒවායි. ඔක්ස්ෆර්ඩ් යුනිවර්සිටි ප්‍රෙස්, කේම්බ්‍රිජ් යුනිවර්සිටි ප්‍රෙස් වැනි ඉතා දියුණු ප්‍රකාශන ආයතන පවා අද ද හැඳින්වෙන්නේ යන්ත්‍රාලය යන නමිනි. ඒත් මේ ශත වර්ෂයේ මුල් භාගයේ දී බටහිර රටවල ප්‍රකාශන ක්ෂෙත්‍රයේ ඇති වූ වෙනස්කම් ශ්‍රී ලංකාවට අත් නොකර ගත් හේතුවෙන් අපගේ ප්‍රකාශන ආයතන තාමත් යන්ත්‍රාල වශයෙන්ම පවතිනවා. බටහිර රටවල නමින් යන්ත්‍රාල වුවත් ඒවා සංවිධානය වූ ක්‍රමානුකූල පොත් ප්‍රකාශන ආයතන ලෙස වර්ධනය වී තිබෙනවා.

මට පෙනෙන හැටියට ප්‍රකාශකයෙකු අතින් සිදු විය යුතු වැදගත්ම මෙහෙය දේශීය අවශ්‍යතා අනුව ප්‍රකාශනය සඳහා පොත් තෝරා ගැනීමයි. ශ්‍රී ලංකාවේ එසේ නොවීම ප්‍රකාශන ක්ෂේත්‍රයට මුහුණ පාන්නට සිදු වී ඇති විශාලතම ගැටළුවයි. එවැනි තේරීමක් නොකිරීම නිසාම අපගේ සාක්ෂරතා මට්ටම හා අධ්‍යාපන මට්ටමට ගැලපෙන අයුරින් සාහිත්‍ය වර්ධනයක් හෝ පොත්පත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ වර්ධනයක් හෝ සිදු වී නැහැ. මා මෙහි දී සාහිත්‍යය යන වචනය භාවිතා කළේ සාහිත්‍ය යන වචනයේ අපි දන්නා සුලභ අර්ථයෙන් නොවේ. සාහිත්‍ය යනුවෙන් අප සාමාන්‍යයෙන් හඳුන්වන්නේ නවකථා, කෙටිකථා, පද්‍ය වැනි නිර්මාණාත්මක සාහිත්‍ය අංගයන්. නමුත් සාහිත්‍ය යන්නට විද්‍යා සාහිත්‍යය, නීති සාහිත්‍යය, නිර්මාණ සාහිත්‍ය වැනි සියල්ලක්ම අවශ්‍ය බව මගේ හැඟීමයි. සාහිත්‍ය යන්න මා මෙහි දී යොදා ගත්තේ ඒ සියළුම අංග අයත් වන අයුරින්, අපගේ සාක්ෂරතා මට්ටමටත්, අධ්‍යාපන මට්ටමටත් ගැළපෙන අයුරින් සාහිත්‍ය වර්ධනයක් සිදු වී නොමැති බව පෙන්වා දීමට උදාහරණ කිපයක් ගෙන හැර දැක්වීමට පුළුවන්. ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, පරිගණක විද්‍යාව, ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය හා කළමනාකරණය වැනි විෂයයන් උසස් මට්ටමින් හැදෑරීමට අවශ්‍ය වූ විට අපට හැම විටම පිටරට ප්‍රකාශයට පත් කළ පොත් සොයා යන්නට සිදු වී තිබෙනවා. සමහර දියුණු ප්‍රකාශන කර්මාන්ත ඇති ආසියාතික රටවල මෙවැනි තාක්ෂණික විෂයයන් පිළිබඳව ලියවුනු සම්මත පොත් පෙල මෙන්ම ආශ්‍රය පොත්ද දේශීය වශයෙන් මුද්‍රණය කරවා විකිණීමට හෝ ඉගැන් වීමේ භාෂාව මව් බස වූ අවස්ථාවලදී මව් බසට පරිවර්තනය කරවා ප්‍රසිද්ධ කිරීමට විධි විධාන සලස්වා තිබෙනවා. එය බොහෝවිට කෙරෙන්නේ පෞද්ගලික ප්‍රකාශකයන් විසින්. ඉන්දියාව, ජපානය, තායිලන්තය මීට නිදසුන් වශයෙන් දැක්විය හැකියි. ජපානයේ දී මා දුටු දෙයක් මෙඩිකල් ජර්නල් ඇමරිකන් මෙඩිකල් ජර්නල්, ඇමරිකන් සයන්ටිෆික් ජර්නල් ඒවා ඔක්කොම ජපන් භාෂාවට පරිවර්තනය කරලා ඒවා නිකුත් කරනවා. ඒ වාගේම තායිලන්තයේ තියෙනවා, ඔය විදේශීය, දේශීය සියලුම ජර්නල් පවා, සඟරා පවා. ඒ වගේම දැන් අපි හැම වෙලාවෙම වෛද්‍ය විද්‍යාව ගැන හොයන්නේ ඉංග්‍රීසි පොත්පත්. ඒවා ඔක්කොම එංගලන්තේ අච්චු ගහපු ඒවා. නමුත් ඉන්දියාවේ ඒ පොත්ම ඉන්දියාව තුළ අච්චු ගහනවා. ඒවා අච්චු ගහලා ඉන්දියාව තුළ බෙදා හරිනවා. නමුත් අපේ එහෙම වැඩ පිළිවෙලක් ඇත්තේ නැහැ. අපි හැම වෙලාවෙම ඉන්දියාවෙන් හරි එංගලන්තෙන් හරි ගෙන්නා ගන්නයි බලන්නේ. ශ්‍රී ලංකාවේ ද මෙවැනි ක්‍රියා මාර්ගයක් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ගෙන තිබුණ ද, දැන් එය දේශීය පාසල් පොත් මුද්‍රණය සහ ප්‍රකාශන කටයුතුවලට පමණක් සීමා වෙලා තියෙනවා. ඒක ආරම්භ කරපු කාලේ හුගාක්, විශේෂයෙන් ලංකාවට අවශ්‍යව තිබුණු ඉතා හොඳ පාඨ ග්‍රන්ථ පොත්, විශේෂයෙන්ම විද්‍යා පොත්, ආර්ථික විද්‍යා පොත් පරිවර්තනය කරලා, ඒ වගේම මෙහේ අය ලවා ලියවාගෙන මෙහේ ප්‍රකාශයට පත් කළා, දේශීය අවශ්‍යතා සම්පූර්ණ කරන්ට, ඒ කාලේ තිබුණු. අනෙක් අතට උසස් මට්ටමට ඉගෙනීම පසෙක තබා උසස් පෙළ මට්ටම තෙක් විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය වැනි විෂයයන් ඉගෙනීම සඳහා වත් පොත් තිබේ ද? එක් දහස් නවසිය පනස් ගණන්වල සිට ඉහත කී විෂයයන් සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම කළත්, තවමත් එනම් ආසන්න වශයෙන් අවුරුදු තිස්පහ කට පසු අවදියකදීවත් ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් උදෙසා ලියවුනු පාඨ ග්‍රන්ථ ඇත්තේ ඉතා සුළු වශයෙන්. මා මේ කරුණු දකින්නේ ප්‍රකාශකයා විසින් තම යුතුකම් පැහැර හැරිය අවස්ථාවක් හැටියටයි. විශේෂයෙන්ම ප්‍රකාශකයා, පෙළඹීලා තියෙන්නේ ලංකාවේ තමන් අතට ගෙනැත් දෙන පොත් අච්චු ගහලා ප්‍රකාශයට පත් කිරීමට පමණයි. දේශීය අවශ්‍යතා නැත්නම් ඒ ප්‍රකාශන ආයතනයේ අවශ්‍යතා අනුව පොත් ලියවා ගැනීමට හෝ කර්තෘන් උනන්දු කිරීමට කිසිම පියවරක් ගන්නේ නැහැ. දැන් අපි ලේක්හවුස් ආයතනයෙන් විද්‍යා පොත් පෙලක් ප්‍රකාශයට පත් කරන්න තීරණය කරගෙන උසස් පෙල මට්ටමට සෑහෙන මහන්සියක් අරගෙන යෙදුන නිසා, දැන් ටික ටික එකතු කරගෙන යන්න පුළුවන් වෙලා තියෙනවා. අපි කර්තෘන්ව යොමු කරගත්තා මේ කාර්යයට. ඇත්තෙන් ම අපෙන් කෙරෙන්න ඕනෑ යුතුකම අන්න ඒකයි. අපේ අවශ්‍යතා දිහා බලන්නට ඕනෑ. උසස් පෙළ දක්වා ළමයින්ට ඉගෙන ගන්ට නම් ඒ අවශ්‍ය පොත්පත් අපි සපයන්ට ඕනා. අපි නිකං විකිණෙන පොත් විතරක් ගහලා ඒකෙන් සල්ලි හම්බ කරන එක මදි. අපි මේ වැඩ කටයුත්ත දිගටම කරගෙන යන්නට නම් දේශීය අවශ්‍යතා, පාඨක අවශ්‍යතා ගැන සලකා බලන්ට ඕනා. තවත් කාරණයක් තියෙනවා. අපි හැමවිටම කියනවා කියවීමේ පුරුද්ද පාසල් සිසුන් තුළින් මෙන්ම උසස් අධ්‍යාපනය ලැබුවන්ගෙන් ද බැහැර වී ඇති බව. එහෙත් ප්‍රාථමික සිසුන් තුළ කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමෙහි ලා ඔවුන්ට දිය හැකි නිර්මාණ සාහිත්‍ය කෘති කීයක් දැන් වෙළඳපොලේ ඇත්ද? මට හිතෙන හැටියට නම් එය සංඛ්‍යාවෙන් විසිපහ වත් අඩු තරම්. ඉතාම සුළු සංඛ්‍යාවයි මේ විදිහේ තියෙන්නේ. මේ හිඟය ඇත්තේ නිර්මාණ සාහිත්‍ය ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි. වෙනත් භාෂාවලින් ළමයින් සඳහා ලියවී ඇති නවීන විද්‍යා කෘති දෙස බලන විට අපගේ පොත් ප්‍රකාශන තත්ත්වය ගැන බලවත් කණගාටුවක් ඇති වෙනවා. අපගේ ළමා විද්‍යා පොත්වල හඳේ ආවාට

ගැනත්, දැනට අවුරුදු ගණනාවකට පෙර සොයා ගනු ලැබූ ප්ලූටෝ, යුරේනස් වැනි ග්‍රහලෝක ගැනත් සඳහන් කරන විට වෙනත් රටවල පළ වන ළමා විද්‍යා කෘතිවල ක්වාෂර, බ්ලැක්හෝස් ගැන සඳහන් වෙනවා. මෑතකදී සොයා ගත් දේවල් අපේ පොත්වල මේ වගේ සඳහන් වෙන්නේ නැහැ. ග්‍රහලෝක ගැන කථා කරනවා, ඉස්සර කාලේ බොහොම පැරණි දේවල්. ඒ වගේම අපේ විද්‍යා පොත්වල පදාර්ථයේ ඝන, ද්‍රව, වායු යන ත්‍රිවිධ අවස්ථා ගැන සඳහන් වෙතත් පදාර්ථයේ හතරවැනි අවස්ථාව වන ප්ලාස්මා අවස්ථාව ගැන සඳහන් වෙන්නේ නැහැ. ප්ලාස්මා අවස්ථාව පදාර්ථයේ ඇති බව සොයා ගෙන දැනට අවුරුදු හතලිහ කට වැඩි කාලයක්. ඒ අනුව බලන කොට අපේ විද්‍යා පොත් පවා යල් පැන ගිය බව පේනවා. මම මේ විද්‍යා විෂයයන් උදාහරණ හැටියට ගත්තට අනෙක් හැම විෂයයකමත් මේ තත්ත්වය එහෙමමයි. හුඟාක් ළමයින් සඳහා ලියවෙන පොත්පත් අළුත් මුහුණුවරක් අරගෙන නැහැ. අළුත් මුහුණුවරක් ගැනීම අවශ්‍යයි. මොකද, ලෝකය වෙනස් වෙිගෙන යන නිසා, අර ඉස්සර කාලේ හාවාගෙයි, ඉබ්බාගෙයි කථාව කියනවාට වඩා පරිගණක යුගයට ආසූ අවස්ථාවක අපි අළුත් විදිහේ නිර්මාණ ළමයින් තුළට ඇති කරන්න ඕනා. එතකොට තමයි ළමයින්ගේ මනස දියුණු වෙන්නේ. අන්න ඒ කාරණය අපි කොයි වෙලාවකවත් සලකා බලා නැහැ. මෙය පොත් ප්‍රකාශනයේ යෙදී සිටින ප්‍රකාශකයන්ගේ දුර්වලකමක් නොවෙයි ද ? ඒ වාගේම අද පළවන සාහිත්‍ය කෘති, නිර්මාණ කෘති අතර පවා මම දකින්නේ ඒකාකාරී බවක්. සමහර විට මෙහෙම කියන කොට හුඟක් දෙනා මාත් එක්ක විරුද්ධ වෙයි. නමුත් මම ඒක කියන්න අදහස් කළේ බොහෝ කථාවල ආකෘතියත්, තේමාවත්, භාෂා ශෛලියත් එකිනෙකට වෙනස් වෙන්නේ ඉතා කලාතුරකින්. නවකථාවලින් බොහෝ විට පිළිබිඹු වන්නේ මාර්ටින් වික්‍රම සිංහ නිසා කොග්ගලත්, සූරවීර, ජයතිලක වැන්න වුන් නිසා සියනෑ කෝරලයත්, තවත් නූතන ලේඛකයන් කිහිප දෙනෙක් නිසා රයිගම් කෝරලයේ ජන ජීවිතයත් පමණයි. ඒ හැර අනෙක් ප්‍රදේශවල ජන ජීවිතය හෝ අපට හිසරදයක්ව ඇති ජනවාර්ගික ගැටුම් ගැන හෝ ලියවෙන නිර්මාණ කෘති ඇතොත් ඒ ඉතා සුළු වශයෙන්. මෙවැනි වර්ධනයකට හේතුව ද පොත් ප්‍රකාශකයාගේ දුර්වලකමක්.

බටහිර නවකථා මීට ඉඳුරාම වෙනස් මහක් ගත් බව පේනවා. එක් නිදසුනක් ලෙස දෙවන ලෝක යුද්ධ සමයේ යම් යම් සුළු සිද්ධීන් ගැන ලියවුණු නවකථා ගෙන හැර දැක්විය හැකියි. බොහෝ විට ඒවා ලියවී ඇත්තේ ප්‍රකාශකයාගේ ඉල්ලීම පරිදියි. ප්‍රකාශකයාගේ පැවරුමක් ගත් ඒ ලේඛකයා ඒ සිද්ධිය පිළිබඳ පර්යේෂණයක් කරනවා. ඒ පර්යේෂණය මත තමයි ඔහුගේ නිර්මාණය ඉදිරිපත් කරන්නේ. සමහර අවස්ථාවල ඒ පර්යේෂණය කරන අතරතුර ප්‍රකාශකයා වෙත ඉදිරිපත් කරන වාර්තා වෙනම පර්යේෂණාත්මක කෘතියකට ප්‍රමාණවත් තරම් වටිනාකමකින් යුත් වාර්තා වෙනවා. අපි ඇත්තෙන්ම මේ රටේ දී කිසිම විටෙක කර්තෘවරයෙක් පෙළඹවීමක් කරන්නේ නැහැ. ප්‍රකාශකයා එන ඕනෑ දෙයක් ගහනවා. බොහෝ විට කරන්නේ අනුකරණයක්. වෙනත් බොහෝ සමාජවල දකින්නට නැති තරම් අනුකරණයට හුරු පුරුදු සමාජයක සිටින අප ප්‍රකාශකයන්ද අනුකරණයට හොඳින්ම ඇබ්බැහි වී ඇති බව පේනවා. විරාගයෙන් පටන් ගත් පරාජිත නවකථා ගොන්නත්, ගොළු හදවතින් පටන් ගත් ප්‍රේම කථා ගොන්නත් ප්‍රකාශකයාගේ මේ අනුකරණ රටාවේ ප්‍රතිඵලද කියලා මට සැක හිතෙනවා. මොකද ඒවා හොඳට විකිණුනා ඒ කාලේ. ඒක නිසා ඒවා දිගටම ගහගෙන ගියා කියලයි මට හිතෙන්නේ. මගේ අදහසක් මේක. ඒක නිසා නවකථාව ඉතාම දුර්වල මට්ටමට වැටෙන තරම් එක්දහස් නමසිය අසූපහ අසූහය වෙන කොට ඉතාම පහල මට්ටමට වැටුනා නවකථාව. නවතාවකින් තොරව එකම ඌරුවකට පල වුනු මෙවැනි සිංහල නවකථා සිංහල නවකථාවේ අභිවෘද්ධියට හරස් වූවක් සේ මට පෙනෙන්නෙ. පොතක් ප්‍රකාශයට පත් කරන ප්‍රකාශකයින් ලාභයක් ලැබිය යුතුයි. ඒ අතරම සාහිත්‍ය වර්ධනය කෙරෙහිද සිත යොමු කිරීම අත්‍යවශ්‍යයයි. ''**පොත් ප්‍රකාශකයා සාහිත්‍ය-යක් ගොඩ නඟයි**'' යන කියමනෙහිද ගම්‍ය වන්නේ මෙම සත්‍යයයි. සාහිත්‍යයක් ගොඩ නඟන අයුරින් පොත් ප්‍රකාශනයේ නොයෙදීම මා ඉහතින් සඳහන් කළාක් මෙන් පොත් ප්‍රකාශන ක්ෂේත්‍රය කෙරෙහි බලපාන ප්‍රධානම ගැටලුවක්. අධ්‍යාපන ක්ෂේත්‍රයට හා සාක්ෂරතා මට්ටමට මෙන්ම ජනතාවගේ රසඥතා මට්ටමට ද මෙම කරුණු කෙතරම් දුරට බලපා ඇත්දැයි සාකච්ඡා කිරීමට මම බලාපොරොත්තු වෙනේනේ නැහැ.

පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයට බලපාන තවත් ගැටළුවක් නම් ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් නොමැති වීමයි. මෙයට හේතු කීපයක් තියෙනවා. එකක් ආයෝජනයේ අවදානම. ලාභයක් සමඟ පොත් නිෂ්පාදනය සඳහා කෙරෙන ආයෝජනය නැවත ලබා ගැනීමට අවම වශයෙන් අවුරුදු තුනක කාලයක් වත් ගත කරන්නට සිදුවෙනවා. එසේ කළත් එසේ හැකි වන්නේ පොත් අලෙවිය අතින් සාර්ථක වුවහොත් පමණයි. බොහෝ විට අපට කර්තෘවරු කියන දෙයක් තමා මේ පොත ගැන හය වෙන්ට එපා, මේකෙන් පිටපත් තුන්දහක් නෙමෙයි පන්දහක් ගහන්න, එක මාසයක් ඇතුළත විකිණිලා යයි. නමුත් අපි අත්දැකීමෙන් දන්නවා, පොත් දහයක් වර්ෂයකට ගැහුවොතින් ඒකෙන් පහක් කපලා පල්ප් හදන්න යවන්න වෙනවා. එහෙම නැත්නම් ජේවමන්ට් එකේ විකුණන්න වෙනවා. ඒක සාමාන්‍යයෙන් අපේ අත්-දැකීමක්. ඒකම කියලා තියෙනවා පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ පතාක යෝධයකු හැටියට සැලකෙන සර් ස්ටැන්ලි අන්වින් ඔහු කියන අන්දමට, ඔහුගේ අත්දැකීම අනුව ප්‍රකාශයට පත්වන පොත් වලින් සියයට පනහක් ම අලෙවිය අතින් අසාර්ථකයි. ආයෝජනයේ අවදානම ඉන් මැනවින් පැහැදිලි වෙනවා. මේ අවදානම එසේ තිබියදීම ශ්‍රී ලංකාවේ පාසැල් පොත් සම්පාදනය හා ප්‍රකාශනය රජයට පවරා ගැනීම නිසා පොත් කර්මාන්තය කෙරෙහි ආයෝජනය තවත් පසුබෑමකට ලක් වුනා. ආයෝජනය අඩු වන බව වටහා ගැනීමට පාසල් පොත් සම්පාදනය හා ප්‍රකාශනය පෞද්ගලික පොත් ප්‍රකාශකයන් සතුව පැවැති අවදියේ සාහිත්‍යය වැඩුන වේගය හා අද පවතින තත්වය සලකා බැලීම පමණක් ප්‍රමාණවත්. ඒ කාලය තුළ ශාස්ත්‍රීය පොත් කොච්චර ප්‍රමාණයක් පලවුනාද? මම දන්නවා අපේ ආයතනයෙන්ම ඒ කරපු ශාස්ත්‍රීය පොත් පල කිරීම සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුනා. මොකද අපිට ඒක කරන්න විදිහක් නැහැ, ආයෝජනය මදි කම නිසා.

ගුත්තිල කාව්‍ය වර්ණනා, සිද්ධාන්ත පරීක්ෂණය, ඔය වගේ පොත් ඒ කාලේ පල වුනේ ඇත්තෙන්ම පාසැල් පොත්වලින් අපට ලැබුණු ලාභයෙන් කොටසක් ඒ සඳහා යෙදවුනු නිසායි. මා කලින් සඳහන් කළ පරිදි ආයෝජනය අඩු වූ බව වටහා ගැනීමට පාසැල් පොත් සම්පාදනය කිරීම හා ප්‍රකාශනය පෞද්ගලික ප්‍රකාශකයින් සතුව පැවැති අවදියේදී සාහිත්‍ය වර්ධනය වූ වේගය හා අද පවතින තත්ත්වය සලකා බැලීම පමණක්ම ප්‍රමාණවත්. දේශීය අවශ්‍යතා සලකා ඒ අනුව ප්‍රකාශයට සුදුසු පොතපත තෝරා ගැනීමට නම් නොමසුරු ආයෝජනයක් තිබිය යුතුයි. ආයෝජනය මඳ වීම අවශ්‍යතා සපුරාලීම කෙරෙහි දැඩි බලපෑම් ඇති කරනවා. දැන් අපට අවශ්‍ය නම් යම්කිසි පොතක් ලියාගන්ට අපි ඇත්තෙන්ම එයට කර්තෘවරයා යොමු කරන්ට ඕනැ. ඒ කර්තෘවරයාට ඒ විදිහේ ගෙවීමක් කරන්ට අපිට හැකියාවක් තිබෙන්ට ඕනා. ඒ විදිහේ හැකියාවක් නැතිව ඔහුව ඒ විදිහේ කාර්යයකට යොමු කරන්ට අපට පුළුවන් කමක් නැහැ. අන්න ඒක නිසායි මම කීවේ නොමසුරු ආයෝජනයක් තියෙන්ට ඕනැයි කියලා. අපි මේ විදිහේ නිදසුනක් ගෙන බලමු. ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීම අවශ්‍යතාව ගැන අවධාරණය කෙරෙන සහ ඉංග්‍රීසි පොතපත හදාරමින් සිංහලින් අධ්‍යාපනය ලබන මේ අවදියේ ප්‍රාමාණික ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයක් බිහි වී තිබෙනවා ද? අද කෝකටත් තෛලය මෙන් ඇත්තේ මලල සේකර ශබ්ද කෝෂය පමණයි. මලලසේකර ශබ්ද කෝෂය සම්පාදනය වූ අවදියත් මේ වකවානුවත් සසඳන විට ශබ්ද කෝෂයක අවශ්‍යතාව කොතරම් දුරට වෙනස් වී තිබේ ද? ඉංග්‍රීසි පොත්පත් සිංහලට පරිවර්තනය කිරීම, ඉංග්‍රීසි වචනවලට පර්යාය සිංහල වචනවල ඇති අවශ්‍යතාව ගැන සලකා බලන විට මේ නූතන අවශ්‍යතාවට ගැලපෙන ශබ්දකෝෂයක් තිබිය යුතුමයි. මලලසේකර ශබ්දකෝෂය අරගත්තම කවදාවක්වත් පර්යාය වචනයක් හමුවෙන්නේ නැහැ. ඒකෙ තියෙන්නේ වචනය පැහැදිලි කරලා, එහෙම නැත්නම් වචනය විස්තර කරලා විතරයි. දැන් අපට අවශ්‍ය ඒ දෙය නොවෙයි, මම හිතන හැටියට. මොකද, අපි හුඟක් ඉංග්‍රීසි දේවල් ඉංග්‍රීසි මාධ්‍යයෙන් තියෙන දේවල් පරිවර්තනය කරන්න, ඉංග්‍රීසියෙන් අපේ භාෂාවට විෂය කරුණු වැද්ද ගන්න මහන්සි ගන්න කාලයක්. එහෙම කාලයක අපට ඕනැ වෙනවා හැම වෙලාවෙම සුදුසු පර්යාය වචන, එම වචනෙට සුදුසු සිංහල වචන. දැන් 'රිකවර්' කියන වචනෙට අපි බැලුවොත් 'ආපසු ලබාගෙන' ඔය ආදී නොයෙකුත් දේවල්, ටෙක්නිකල්ටර්මස් තියෙන්ට පුළුවන්. නමුත් ඒවත් අඩංගු වුනු ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයක් තිබිය යුතුයි කියලයි මගේ හැඟීම. ඒක සාමාන්‍යයෙන් කාර්යාල අවශ්‍යතා වගේ හැම දෙයක්ම සැපයීමට. එවැන්නක් සම්පාදනය කිරීමට ප්‍රමාණවත් ආයෝජනයක් කිරීමට අද ප්‍රකාශකයකුට නොහැකියි. මේ තත්ත්වයම ලා සිංහල විශ්වකෝෂයක්ද, ළමා විශ්වකෝෂයක්ද, ඉංග්‍රීසි සිංහල විද්‍යා හා තාක්ෂණික ශබ්දකෝෂයක්ද අත්‍යාවශ්‍යයි. නමුත් මේවා සම්පාදනය කිරීමෙහි ලා ප්‍රමාණවත් ආයෝජනයක් මේ ක්ෂේත්‍රයක නැහැ.

අලෙවිය හා ප්‍රචාරය සම්බන්ධයෙන් පවත්නා බාධක තවත් ගැටලුවක්. අධික ප්‍රචාරක වියදම්, බෙදාහැරීම් වියදම් මෙන්ම නිෂ්පාදන වියදම් ද පොත් මිල ඉහල යෑමට හේතු වී තිබෙනවා. අලෙවිය මත ඉන් ඇතිවන බාධකවලට අමතරව පාසල් පොත් නොමිලේ බෙදාහැරීම හේතුවෙන් තවත් තර්ජනයක් මතු වී තිබෙනවා. එනම් දිවයින පුරා පිහිටි පොත් අලෙවි පද්ධතිය බිඳ වැටීම. මේ ගැන දීර්ඝ වශයෙන් කථා කිරීමට මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

මීළඟට කර්තෘ ප්‍රකාශක පොත් ප්‍රකාශනය ශ්‍රී ලංකාවෙ සුලභවීම පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ ක්‍රමවත් වර්ධනයට මහත් බාධාවක් වී තිබෙනවා. තරහ වුනත් ඒ දෙය කියන්නට සිදු වෙලා තියෙනවා. පොතක් යනු මුද්‍රිත පිටු කිහිපයක් කවරයක් තුළ ගොනු කර අමුණා තිබෙන කඩදාසි ගොන්නක් විය යුතු නැහැ. මොනයම් හේතුවක් නිසා හෝ ප්‍රකාශකයකු ලවා තම පොත ප්‍රකාශයට පත් නොවුනු විට කෙසේ හෝ පොත මුද්‍රණය කරවා පාඨකයා අතට තම පොත පත් කිරීමට වෙහෙසෙන පොත් කර්තෘවරු ''කර්තෘ ප්‍රකාශක' ලෙස හැඳින්විය හැකියි. එවැනි පොතක් කිසිවිටක සංස්කරණයට ලක් වෙන්නෙ නැහැ. නිමාව, සැලසුම, ගැන ප්‍රමාණවත් අවධානයක් යොමු කෙරෙන්නෙ නැහැ. නිමාව සැලසුම ගැන අවසන් තීරණය ගන්නෙ කර්තෘවත්, මුද්‍රණකරුවාවත් නොව මුද්‍රණාලයේ සේවය කරන සේවක පිරිසයි. ඒ ගොල්ලන්ට ඕනැ හැටියටයි ඒ ටික කරන්නෙ. අපට අවශ්‍ය හැටියට කවදාවත් කෙරෙන්නෙ නැහැ. මේක කෙරෙන්නෙ අර මම ඉස්සෙල්ලා කියපු විදිහට ප්‍රකාශකයාත් එක්ක තරහ වෙලා ගියහම, මීළඟ පොත මම ගහනවා කියලා ඒ පොත ගහන්න අරගත්තම. සමහර අවස්ථාවලදී ඒක සාර්ථක වෙනවා. ඊට වඩා හානියක් සිදුවෙනවා, නියම විදිහට සංස්කරණය නොවුනු හොඳ නිමාවකින් පොතක් ඉදිරිපත් නොවුනහම. පොතක මුල් පිටු එක් එක් පිටුවකට විශේෂ වූ කාර්යයක් සඳහා වෙන් වී තිබෙනවා. දැන් අපි දන්නවා පොතක මුල් පිටු තියෙනවා. මුල් පිටුවෙ පළමුවෙන්ම තියෙන්නට ඕනා පොතෙ නම විතරයි. අපි ඒකට බාස්ටාඩ් පේජ්, එහෙම නැත්නම් හාෆ් ටයිටල් පේජ් කියනවා. ඒකෙ අනෙක් පැත්තෙ සඳහන් වෙලා තියෙනවා කර්තෘගේ අනෙකුත් පොත් කෘති තියෙනවානම්. ඒක තමා පිළිගත් සම්මතය. ඊට පස්සෙ ටයිටල් පේජ්. ඒකෙ තමා කර්තෘගේ නම, පොතෙ නම. ඊට පස්සෙ ප්‍රකාශකයාගේ නම. ටයිටල් පේජ් එකෙ පිට පැත්තෙ තියෙන්නෙ ඕනැ ප්‍රකාශ කරපු වර්ෂය, කර්තෘගේ අයිතිය සහ පොතෙ අයිතිය කා සතුද? මුද්‍රණය කලේ කොහේද? ආදී සියල්ල. අයි.එස්.බී.එන්. අංකය වගේ සියලුම දේවල් ඒකෙ තියෙන්නට ඕනා. ඊට පස්සෙ තියෙන්නට ඕනා මේ පොත පිළිගැන්වීමක් කරනවා නම්, නැත්නම් 'ඩෙඩිකේෂන්' එකක් කරලා ඒක තියෙන්නට ඕනැ. සාමාන්‍යයෙන් ඒ ඩෙඩිකේෂන් එකක් තියෙන පිටුවෙ අනෙක් පැත්ත හිස්ව තියෙන්නට ඕනා. ඔය විදියට එන පිළිවෙලක් තියෙනව. මේ කර්තෘ ප්‍රකාශක පොත්වල ඒ විදිහේ සම්මතයක්, පිළිවෙලක් රැකෙන්නෙ නැහැ. ඒක ඇත්තට ම මම ඉස්සෙල්ලා කිව්ව වගේ ඒවා යොදන්නෙ අර මුද්‍රණාලයේ සේවය කරන සේවකයෝ, ඒ ගොල්ලන්ට ඒ පිළිබඳව වැටහීමක් නැහැ. එවැනි වැටහීමක් ඇත්තේ ප්‍රකාශකයෙකුට පමණයි. කර්තෘ ප්‍රකාශක පොත්වල මුල් පිටු ගැනවත් ඒවා තිබිය යුතු අනුක්‍රමය ගැනවත් කිසිම තැකීමක් නැති බවයි මට පෙනෙන්නේ. සම්මතයෙන් බැහැර වී ඇති මේ දුර්වලකම් සමහර විට නොසලකා හැරිය හැකියි. එහෙත් කර්තෘ ප්‍රකාශක පොත්වල

ඇති සමහර දෝෂ කෙසේවත් නොසලකා හැරිය නොහැකියි. නිදසුනක් වශයෙන් වර්ණයෝජන පෙන්වා දිය හැකියි. වර්ණයෝජනය කලාවක් මෙන්ම විද්‍යාත්මක පසුතලයක් මත වර්ධනය වූ ශිල්පයක්. 'ටයිපොග්‍රැපික්' යනුවෙන් ඉංග්‍රීසියෙන් හඳුන්වන මෙම ශිල්පය පොතක් පාඨකයා වෙත ඉදිරිපත් කිරීමේ කාර්යයේ දී වැදගත් මෙහෙයක් ඉටු කරනවා. මනෝ විද්‍යාත්මක වශයෙන් ද වර්ණ යෝජන යේ වැදගත්කම නොසලකා සිටිය යුතු නැති තරම්. අකුරුවල ප්‍රමාණය, වචන අතර පරතරය, පේලි අතර පරතරය, ඡේද අතර පතරය වැනි කරුණු එක් එක් විෂය අනුව, වයස් සීමාව අනුව වෙනස් විය යුත්තක්. 'ටයිපොග්‍රැපික්' කියන එක උගන්වන්නේ අන්න ඒ දෙය. කොයි විදිහෙන් හරි අපි ළමා පොත් කියලා කරන්නේ ලොකු අකුරුවලින් ළමා පොත් ගහන එක. ලොකු අකුරුවලින් ගැහුවොත් ඒක ළමා පොතක්. අන්න ඒ විදිහේ සම්මතයක් අපිට තියෙන්නේ. හුඟක් දුරට වැරදියි. ළමා පොත අපි හිතන්න ඕනෑ මොන වයසට ද මේ ළමා පොත ? ඒ අනුවයි අකුරු තෝරා ගැනීම විය යුත්තේ. ඇත්තෙන්ම ටයිපොග්‍රැපික් කියන ශිල්පය අපිට කියලා දෙනවා ඒ ගැන. නමුත් මේ ගැන කිසිම වැටහීමක් කර්තෘ ප්‍රකාශකයන්ට ඇත්තේ නැහැ.

පොත් ප්‍රකාශනයේදී අපට උරුම වී ඇති තත්ත්වය ගැන කණගාටුවක් ඇති වෙනවා. විශේෂයෙන්ම සූත්‍ර හා සමීකරණ මේ බව මැනවින් පැහැදිලි කරනවා. සූත්‍ර හා සමීකරණ කුමන අදහසක්, කුමන සිද්ධාන්තයක් පිළිබිඹු කරන්නේදැයි වටහා ගැනීම අක්‍රමවත් වූ වර්ණ සංයෝජනය නිසා මහත් අසීරු වෙනවා. මේ සියල්ලටම හේතුව විධිමත් අයුරින් අත්පිටපත් මුද්‍රණයට සකස් නොවීමයි. මෙවැනි කාර්යය සඳහා ප්‍රවීන අත් පිටපත් සැලසුම්කරුවෙකු, සැකසුම්කරුවෙකු එනම් ''කොපි එඩිටර්ස්'' වරුන් ඇත්තේ කීයෙන් කී දෙනෙක් ද? එවැන්නන්ගේ සේවය කර්තෘ ප්‍රකාශකවරුන් විසින් නොසලකා හැර තිබීමත්, තම කෘතිය පිළිබඳ ඔවුන් ඇතිකරගන්නා උද්දමයත් එවැනි දුර්වලතාවනට හේතු වී තිබෙනවා. මා ඉහතින් සඳහන් කළ වර්ණයෝජනයේ දෝෂ මෙන්ම පිටපත් සංස්කරණයේ දෝෂ ද නොසලකා හැරිය නොහැකියි. ශාස්ත්‍රීය කෘති, පෙළ පොත් මෙන්ම නිර්මාණ සාහිත්‍ය කෘති ද මනා සංස්කරණයට භාජනය විය යුතුයි. එසේ නොවුණු කල්හි සාවද්‍ය විෂය කරුණු ඇතුළත්වීම සම්මුතියෙන් බැහැරවීම වැනි දෙයක් නොවැලක්විය හැකියි. සංස්කාරකගේ කටයුත්ත කර්තෘගේ අදහස් අනුපිළිවෙලින්, නිරවද්‍යව, පැහැදිලිව හා සම්මතයට එකඟව පාඨකයා වෙත ගෙන යාමට කර්තෘවරයාට සහාය වීමයි. සංස්කාරක කර්තෘවරයාගේ හතුරෙක් හෝ විරුද්ධවාදියෙකු ලෙස ක්‍රියා කිරීම හොඳ පොත් බිහි කිරීමේ කාර්යය උදෙසා අත්හල යුත්තක්. එමෙන්ම තමන් ගැන වූ අධි තක්සේරුව මත විධිමත් සංස්කරණයක් ප්‍රතික්ෂේප කිරීම ද බලවත් වරදක්. පොතේ එන අක්ෂර දෝෂ, සාවද්‍ය විෂය කරුණු හා සංස්කාරක දෝෂ යනාදිය වර්ණ හතරක් යොද ලිතෝ මුද්‍රිත පිට කවරයකින් වසා ගැනීමට උත්සාහ කිරීම පාඨකයා රැවටීමක්.

පොත් ප්‍රකාශනයේ ගැටළු හා ප්‍රවනතා පිළිබඳ කෙරෙන සාකච්ඡාවකදී පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය ගැනත් සඳහන් කළ යුතුයි. අවුරුදු තුනක් පමණ කාලයක් ඇතුළත මෙම ව්‍යාපෘතිය යටතේ මම අදහස් කරන හැටියට පොත්පත් 500 ක් පමණ ප්‍රකාශයට පත් වී තිබෙනවා. එම පොත් අතරින් මම කලින් සඳහන් කල දේශීය අවශ්‍යතා ඉටුවන ආකාරයට හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ රීතීන්ට අනුව ප්‍රකාශයට පත් වූ පොත් කීයක් ඇත්දැයි සලකා බැලීම කාලෝචිතයි. පොත් ප්‍රකාශනය වූ පමණින් සාහිත්‍ය වර්ධනයක් හෝ අවශ්‍යතා ඉටුවීමක් හෝ සිදු විය හැකි යයි බලාපොරොත්තු විය නොහැකියි. මෙම ව්‍යාපෘතිය යටතේ නව කෘතීන් ප්‍රකාශයට පත්වීමට වඩා දැනට මුද්‍රණයේ නොපවතින ශ්‍රේෂ්ඨ සිංහල සාහිත්‍ය කෘතිවල නව සංස්කරණ පුස්තකාල සේවා මණ්ඩලය අනුග්‍රහය යටතේ ප්‍රකාශයට පත්කිරීමට උත්සාහ ගන්නේ නම් වඩාත් කාලෝචිත බව මගේ හැඟීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ නව කෘතීන් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය නම් ළමා විශ්වකෝෂයක්, සම්මත ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයක්, එසේ නැත්නම් සම්මත ඉංග්‍රීසි පෙළ පොතක පරිවර්තනයක් සඳහා යොමු විය හැකියි. එමගින් දැනට කෙරෙන සේවයට වඩා විශිෂ්ඨ ජාතික සේවයක් ඉන් ඉටු වේය යනු මගේ හැඟීමයි.

පොතපත පිළිබඳව ගුරු, සිසු හා දෙමව්පිය තුන් පාර්ශවයෙන්ම දක්වෙන අනවදනාත්මක ආකල්පය අද මේ ක්ෂේත්‍රයේ පවත්නා ප්‍රධානම ගැටලුවයි. තම දූ දරුවන්ට රුපියල් සිය ගණනින් වටිනා ඇඳුම් පැළඳුම් මිලට ගෙන දීමට නොපසුබස්නා දෙමාපියන් බොහෝ විට පොත් මිළ දී ගැනීමේ දී ඒ කෙරෙහි වෙනත් ආකල්පයක් දක්වන බව පෙනෙනවා. ගුරුවර ගුරුවරියන්ද පොත් කියවීමට ළමයින් පෙළඹවීම කෙරෙහි උනන්දුවක් නොදක්වා ඔවුන්ගේ අධ්‍යාපනය පන්ති සටහන්වලට පමණක් සීමා කර ඇති බව පෙනේ. එමෙන්ම වගකිවයුත්තන් ද පොත් ක්ෂේත්‍රය කෙරෙහි බලපාන ප්‍රශ්න දෙස කිසි අවධානයෙන් යුතුව ක්‍රියා කරන බව පෙනෙන්නේ නැහැ. මේක අපට හොඳටම පැහැදිලි වුනා පසුගිය අවුරුදු කීපය තුළ. අපි මහන්සි ගත්තා මේ කාර්යයට රජයේ අනුග්‍රහය ලබාගන්නට. ඒ මොකද ? පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරන්ට නම්, අර මම කලින් කීව හේතුව මත ඒ කියන්නේ පාසල් පොත් සම්පාදනය හා ප්‍රකාශ කිරීම රජයට පවරා ගත්තායින් පස්සේ සියළුම පෞද්ගලික ප්‍රකාශකයන්ට ලොකු පසුබෑමක් අත්කර ගන්නට සිදු වුනා. ඒක නිසා තමයි ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය එතරම් දියුණුවකට ආවේ නැත්තේ. එහෙම නම් ඒක නැවත ගොඩ නඟන්නට නම් රජයේ අනුග්‍රහය අවශ්‍යයි. අපි හුඟක් විට මේ ගැන කරුණු ඉදිරිපත් කළා. ඒ කිසි දේකට මෙතෙක් කිසිම සැලකිල්ලක් ලැබිලා නැහැ. මම හිතන්නේ ඒ ගොල්ලන්ගේ මේ කාරණය ගැන තියෙන අවධානය, ඒ කියන්නේ නොසැලකිල්ල. පොත් ක්ෂේත්‍රය කෙරෙහි ඇති මේ අනවධානය කුඩම්මාගේ සැලකිල්ලක් හා සමාන ලෙස හෝ එය ලැබේ නම් එයත් ඊට වඩා වටිනා හැටියටයි මම සලකන්නේ. ඒ කියන්නේ කුඩම්මාගේ සැලකිල්ලවත් අපිට ලැබෙන්නේ නැහැ කියන එකයි මම කියන්නේ. හොඳ පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයක් ගොඩ නැගීමට නම් පොත් ප්‍රකාශනයේ යෙදෙන පුහුණු ශ්‍රමික කණ්ඩායමක් අවශ්‍යයි. විශේෂයෙන්ම පිටපත් සංස්කාරකවරුන්, ඒ කියන්නේ 'Manuscript Editors' කියන අය. පිටපත් සැකසුම්කරුවන් — 'Copy Editors'

පොත් සැකසුම්කරුවන් 'Book Designers' චිත්‍ර ශිල්පීන්, ඇත්තෙන්ම 'Graphic Artists' කියන වර්ගය පුරුදු පුහුණු කිරීම ගැන අපගේ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යයි. මේ කාර්යයේ ලා ආරම්භයේ සිට මීට දශකයක් පමණ පෙර කාල සීමාව දක්වා, ඒ කියන්නේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය නිදහගන්ට ඉස්සර ඒ මණ්ඩලයෙන් ඉටු කෙරුණු සේවාව ඉතා වැදගත් බව සඳහන් කරන්ට ඕනා. යුනෙස්කෝව හා යුනෙස්කෝ සඳහා වන ජපන් සංස්කෘතික මධ්‍යස්ථානය අනුග්‍රහයෙන් පැවැත්වූ වැඩමුළු ප්‍රකාශන ක්ෂේත්‍රයේ අතිශයින් ප්‍රයෝජනවත් වූ ඒවා. ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය මීට වඩා වැඩි සේවයක් මේ ක්ෂේත්‍රයට කළ යුතුයි.

පසුගිය අවුරුදු දෙක තුනක කාලය තුළ පොත් ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ අංශ ඒකරාශී වී සංගම් පිහිටුවාගෙන ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය මෙහි දී සඳහන් කළ යුතුයි. දිවයිනේ හැම ප්‍රධාන පෙලේ පොත් ප්‍රකාශන ආයතනයක් ම පාහේ එහි සාමාජිකත්වය ලබාගෙන ඇත. පොත් ක්ෂේත්‍රයේ වර්ධනයට මෙම සංගමයෙන් විශාල මෙහෙයක් දැනටමත් ඉටු වී ඇති අතර ඉදිරියට ද එවැනි මෙහෙයක් ඉටු වෙතැයි බලාපොරොත්තු විය හැකියි. පාඨක, ලේඛක, ප්‍රකාශක සම්බන්ධතා වර්ධනය කිරීමෙහිලා පසුගිය අවුරුදු දෙක තුනක පමණ කාලයක සිට ගත් ක්‍රියා මාර්ගය බෙහෙවින් අගය කළ යුතුයි. සාහිත්‍ය ක්ෂේත්‍රයේ පිබිදීමක් ඇති කිරීමට හේතු වූ පොත් දොරට වැඩීමේ උත්සව සංවිධානය කිරීමේ දී ද 1990 වර්ෂය ශ්‍රී ලංකා ජාතික සාහිත්‍ය වර්ෂය බවට ප්‍රකාශයට පත් කරවා ගැනීමේ දී ද මූලිකව ක්‍රියා කලේ පොත් ප්‍රකාශකයින්ගේ සංගමයයි. ප්‍රමාණවත් ආයෝජනයක් මේ ප්‍රකාශන ක්ෂේත්‍රයට ලැබෙන්නේ නම් මා ඉහතින් සඳහන් කළ දුර්වලතා හා අඩුපාඩු මග හරවා ගෙන කටයුතු කිරීමට සංගමයේ සියළු සාමාජිකත්වය ඉදිරිපත් වෙනවාට සැකැයක් නැහැ. ඒ ආකාරයේ පොත් ප්‍රකාශකයන්ගේ සංගමයක් බිහිවීම ප්‍රකාශන ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට යොමු වූ නව නැම්මක් ලෙස සැලකිය හැකියි. ඇත්තෙන්ම මම ඉස්සර සඳහන් කරපු හුඟක් අඩුපාඩුවලට හේතුව ප්‍රමාණවත් ආයෝජනයක් නැතිකම කියලා බොහෝවිට කියන්න පුළුවන්. ඒක නිසා පොත් ප්‍රකාශක සංගමය මේ කාරණා ගැන ඉතා පැහැදිලිව අවබෝධ කරගෙන ඉන්නවා. ඒක නිසා ප්‍රමාණවත් ආයෝජනයක් ලැබෙනවා නම් අපේ අර දුර්වලකම් මග හරවා ගෙන දේශීය අවශ්‍යතා අනුව පොත් ප්‍රකාශනයේ යෙදෙන්නට ලංකාවේ ප්‍රකාශකයන්ට හැකියාව ලැබෙනවා. තවද ක්‍රියාකාරී පොත් වෙළඳ සංගමයක් ද බිහි වී තිබීම මේ සඳහා විශාල රුකුලක්. ඒ සඳහා ද මුල් වී ක්‍රියා කළේ ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශකයන්ගේ සංගමයයි. පසුගිය වර්ෂය ආරම්භ කෙරුණු ශ්‍රී ලංකාවේ සංස්කාරකවරුන්ගේ සංගමය පොත් ප්‍රකාශකයන් වෙත හා ලේඛකයන් වෙත අත් පිටපත් සංස්කරණය, ඒ කියන්නේ "Manuscript Editing" හි ඇති වැදගත්කම පෙන්වා දීම උදෙසාම සකස් වූවක්. ආරම්භක රැස්වීමේදීම සංස්කරණයේ ඇති වැදගත්කම විදහා දක්වෙන සම්මන්ත්‍රණයක් පැවැත්වීමට සංස්කාරකවරුන් ගේ සංගමයට හැකිවිය. විශාල පිරිසක් සහභාගි වූ මේ රැස්වීම තුළින් අත් පිටපත් සංස්කරණය කිරීමේ වැදගත්කම පිළිබඳ පණිවුඩය ප්‍රකාශක, ලේඛක, පාඨක සියල්ලන්ටම රැගෙන යාමට හැකිවීම භාග්‍යයක් කොට සැලකිය යුතුයි. මම කලින් සඳහන් කළා කර්තෘවරුන් සහ ප්‍රකාශකයන් අතර තියෙන සම්බන්ධතාව ගැන. ඇත්තෙන්ම ඒ කාලය වෙනකොට කර්තෘන්ට කෙරෙන ගෙවීම පිළිබඳව කිසිම නිශ්චිත බවක් තිබුනේ නැහැ. ඒක නිසා ප්‍රකාශකයන් සහ කර්තෘන් එක එක්කෙනාට සැලකුවේ එකිනෙකාට ද්‍රෝහී වෙන පුද්ගලයන් දෙකොට්ඨාශයක් හැටියටයි. ප්‍රකාශකයන්ගේ සංගමය බිහි වුනායින් පස්සේ මේ පරතරය වෙනස් කරන්නට හුඟක් මහන්සි ගත්තා. ඇත්තෙන්ම දැන් ඒ තිබුණු විරසකභාවය බිඳිලා නැතිවෙලා ගිහිල්ලා තියෙනවා. බොහෝවිට කියන්නේ ප්‍රකාශකයෝ කර්තෘවරුන් ගසා කන අය හැටියටයි. ඒ විදිහේ දෙයක් වෙන්නේ නැහැ. මොකද ප්‍රකාශකයින්ගේ පැත්තෙන් බලන විට ඇත්තෙන්ම ප්‍රකාශකවරුන් කරන්නේ කර්තෘට සේවයක් වගේම, තමන් ලාභයක් ලබනවා වගේම සමාජයට විශාල සේවයක්. නමුත් මේ සම්බන්ධයෙන් නීතියක් පැනවිලා තියෙනවා මේ 'කර්තෘ හා ප්‍රකාශක අතර සම්බන්ධතා, එහෙම නැත්නම් අයිතිවාසිකම් පිළිබඳ ගිවිසුමක් ලිඛිතව තිබිය යුතුයි කියලා බුද්ධිමය දේපල පනතින්. ඇත්තෙන්ම අපි ඒක අගය කළ යුතුයි. මොකද අප අතර තියෙන සම්බන්ධතා බිඳීමට තිබුන එකම එක කඩොල්ලත් වැහෙන විදිහට ඒ දෙය ඇති කරල තියෙන නිසා. මේ කාරණා දිහා බලන කොට මේ එකිනෙක ක්ෂේත්‍රයේ තියෙන කණ්ඩායම් ඒකරාශී වෙලා සංගම් ඇති කර ගැනීමත්, විධිමත්වීමත් නිසා මේ ප්‍රකාශන ක්ෂේත්‍රයේ කටයුතු අපිට බලාපොරොත්තු වෙන්න පුළුවන් ඉදිරියේ දී, නමුත් ඒක ඉතාම හෙමින් සිදු වෙන කාර්යයක්. අර අපි බලන බටහිර රටවල හා වෙනත් දියුණු ආසියාතික රටවල තිබෙන තත්ත්වයට ම අපේ ප්‍රකාශන ක්ෂේත්‍රයක් දියුණු කර ගන්නට අපිට හැකියාවක් ලැබෙයි කියලා බලා පොරොත්තු වෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම මේ විදිහේ හොඳ දියුණුවක් ඇති වෙන්ට පටන් ගත්තා මීට අවුරුදු තුනකට විතර වගේ ඉස්සර. එතෙක් පැවැති තවත්ත්වය ඇත්තෙන්ම දුර්වලයි.

මම අන්තිමේදී මෙන්න මේ ටික කියන්න ඕනා. මා මෙහිදී දැක්වූ කරුණු සියල්ලම හුදෙක් මගේ පෞද්ගලික අදහස්. මේ ක්ෂේත්‍රයේ මම හිතන්නේ අවුරුදු 20 ක විතර කාලයක සිට මම කටයුතු කරනවා. ඒ ක්ෂේත්‍රය දිහා බලන් ඉන්නකොට මට පෙනී ගිය මගේ පෞද්ගලික හැඟීම් ප්‍රමාණයක් විතරයි මා මෙහි දී ඉදිරිපත් කළේ. මේ අදහස්වල අඩුපාඩු ඇතොත් ඒවා සම්පූර්ණ කර ගැනීමට මම හැම අතින්ම සූදානම්. ඒ හෙයින් මෙහිදී මතුවෙතැයි හැඟෙන සාකච්ඡාවට ඉඩතබා මගේ කථාව මෙයින් අවසන් කරනවා. ස්තූතියි.

(ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී 1990.11.28 දින පවත්වන ලද ජාතික පුස්තකාල දේශනමාලා අංක 06 ඇසුරෙන් සකස් කරන ලද්දකි.)

# Resources of the National Library of Sri Lanka

**Nalini de Silva**

*Deputy Director (Actg.), Sri Lanka National Library Services Board*

The National Library of a country such as ours with a cultural heritage over 2500 years has triple major functions to perform in the context of resource development. For instance to collect and preserve literary, historical and social heritage, to assist local and foreign scholars, researchers, planners, decision makers with current and retrospective bibliographic information related to Sri Lanka, to establish relations with local and foreign libraries. In this process the National Library has to pay attention to resource sharing, avoid duplication of efforts and resources especially being in the capacity of a Third world Country.

Nevertheless through an evolutionary process, institutions such as the Government Record Office now known as the Department of Natinal Archives, the Government Oriental Library, Colombo Museum, The Roayal Asiatic Society (Ceylon Branch) and other Academic and Research Institutes in national level have contributed to the above functions of the NL to a considerable extent.

Although the NL was inaugurated in 1990, on the recommendations of the National Library Committee, resources have been developed since the establishment of the Sri Lanka National Library services Board in 1970. However, resource development during the first decade was rather slow due to inadequate staff, storage and legal provisions.

On the recommendations of the NL committee, the scope or resources to be collected and developed were manuscripts, non-book materials, periodicals, newspapers, unpublished reports, audio visulas, paintings, maps, oral traditions, postage stamps, currency notes, material related to heraldry, honour, etc., of Sri Lanka.

In relation to resource development of the NL the mechanism of obtaining materials is based on the following methods:

1. Legal Deposit
2. Copy right
3. Gifts and exchange
4. Purchases

The present strength of the NL Collection consisting of 1,50,000 items will form the nucleus of the future collection, which eventually expand to millions. The NL purchases 3 copies of each publication one of which is set aside for photocopying and inter-library loans, the other for reference, and the third is kept as the permanent deposit copy.

The resources are well preserved, systematically arranged and grouped into 13 subdivisions comprising of

1. Main Sri Lanka Collection
2. Legal Deposit Collection
3. Periodicals Collection
4. Newspaper Collection
5. Main Reference Collection
6. Foreign Literature Collection
7. Manuscripts and Rare Books Collection
8. Audio Visuals Collection
9. Maps Collcetion
10. Unesco Publications Collection
11. Special Collection
12. Library and Information Scince Collection
13. Folklore Collection

**Main Sri Lanka Collection**

This contains material published in Sri Lanka on Sri Lanka and by Sri Lankans. It has been developed since the inception of the Board and presently consists of 17,432 bound volumes, 125 microfilms and 4,602 microfische. History, Literature, Government Publica tions are the areas of notable strength. The Sri Lanka Collection is enriched with private collections of veteran scholars such as D.E. Hettiarachchi, Tikiri Abeysinghe. This material has been catalogued and classified. The catalogue makes it possible for the user to obtain a publication from five minimum access points ; the Author, Title Subject headings, Class Number, Series, etc. Moreover catalogues of the Royal Asiatic Society (Ceylon Branch), the Sri Lanka Collection of the Colombo Public Library, the Archaeological Depart ment Library, the Leslie De Seram Collection of the

Peradeniya University Library, and part of the Museum Library have been duplicated in cards and arranged systematically and made available to the users to enable them to obtain bibliographic information of resources contained in the above libraries.

## Legal Deposit Collection

The Printers and Publishers ordinance (1885) amended in 1976, made legal provision for the National Library to receive a copy of every publication published in Sri Lanka; and this has augmented the resources of the NL to a great extent.

Generally this includes printed material such as Government Gazettes, Hansards, Acts and Bills, Newspapers, Periodicals, Handbooks, Monographs, Pamphlets, Annual Reports, Administration Reports published locally. The current Legal Deposit law is inadequate to ascertain material such as Cassettes, Video Tapes, Films, Maps and unpublished literature to achieve the objectives of the National Library. Therefore a new legislation should be drawn up to suit the new outlook of the National Library.

The Legal Deposit Collection which has been acquired upto 1991 July, has been sorted, catalogued and classified. The cumulative card index or the National bibliography will help the reader to locate the material by author, title, series, class number and subject headings.

## Periodicals Collection

Where research is concerned periodicals are of great importance. The National Library has decided to cover S & T periodicals in addition to the Social Sciences and humanities, commencing 1990. In the field of social science, effort has been taken to acquire both current & back issues of important titles. Due consideration is given to suggestion of readers and other academic and research institutions when ordering foreign periodicals. Inter library loans, exchanges and gifts are methods of procurement besides purchases. India, Japan, China, Korea have contributed immencely by means of exchanges towards building up our collection. Our holdings comprise of 469 periodical titles, out of which 237 are local. These are accessible through a title index arranged alphabetically. Compilation of a cumulative title index of holdings of major academic and research libraries is also in progress.

## Manuscript and Rare Books Collection

The Manuscript Collection of NL is quite small. It holds about 150 ola manuscripts in Sinhalese, Pali and Sanskrit languages on Buddhist sutras, Sinhalese classical literature, Ayurveda, Occultism, few examples are Kosamba Varnanawa, Sidath Sangarawa, Pansiya Panas Jathaka Potha, Ketakirili Sandesaya, Arista Shathakaya, Prasutha Vidyawa.

The collection covers the period from the nineteenth to the beginning of twentieth century. It is well preserved and maintained for research purposes.

The printed rare book collection reflects on nationally important topics such as politics, economics, cultural and social affairs, etc. Some examples are, "Ceylon Vol." I and III published in 1860, "Ancient Inscriptions in the library of the British Museum 1901, Catalogue of Sinhalese manuscripts in the British Museum 1900. Publicity has been given through the printed media requesting for such materialawith a view to expand the present collection.

## Audio-Visual Collection

The collection building of audio-visual material started a decade after the establishment of the Board. Presently the library holds 125 micro films including post-graduate theses and dissertations on Sri Lanka submitted to local and foreign higher Educational Institutions. In addition to cassettes & gramaphone records, the video tapes and slides cover teaching aids and documentary films on NL activities. Steps should be taken to make producers to deposit a copy in the NL of all slides, video, etc., to facilitate the users to obtain unacessible such materials. In this context priority should be given to the materials contained in the SLBC, Film Corporation and Rupavahini.

## News-paper Collection

Attaining legal deposit status the NL receives all the local newspapers irrespective of language and periodicity since 1976. Present stock includes 286 titles in Sinhalese, 57 in English, 07 in Tamil and 07 in foreign languages. This collection is arranged according to the chronological order and an index is maintained. The NL has negociated with the Associated News Papers to acquire during the course of this year a large collection of their back issues prior to 1976.

Moreover the NL has commenced building up a news paper clippings collection on feature articles on social science and humanities.

**Main Reference Collection**

Besides general reference sources such as Encyclopedias, Dictionaries, Bibliographies attempts have been made to purchase valuable special reference sources in great damand such as the Social Science Citation Index (SSCI), Bibliographies of other countries, Science Citation Index, Chemical Abstracts, Biological Abstracts, Current Contents.

**Foreign Literature Collection (Overseas Publications)**

This collection has been enhanced by material received under the exchange programme, and by gifts and purchases. The stock consists of books and other materials on Sri Lanka published overseas together with factual publications of individual countries such as Australia, U.S.S.R., U.K., U.S.A., Malayasia.

**Map Collection**

The map collection of the NL comprises of satalite maps, Contour maps, World maps, Road maps, Historical maps, etc. The NL holds 808 maps related to Sri Lanka. Maps could be accessed through the title index.

**Unesco Collection**

With the amalgamation of the Unesco National Commission Library in 1983, the strength of the Unesco collection has increased to 8293 inculding monographs, reports, etc. It is classified and the Unesco Thesaurus has been used for subject headings. There is a constant flow of publications and the NL plans to develop this as the Centre for Unesco Publications.

**Special Collections**

In addition to the Martin Wickramasinghe Collection this includes collections on Buddhism, Hinduism, Ayurveda, ISBN deposit copies and copies of the Book Development Project. A Seperate catalogue is available to access the Martin Wickramasinghe collection. If there is a sufficient demand in any other field the NL will endeavour to develop such special collections.

**Library and Information Science Collection**

As the leading authority in this field the NL maintains a comprehensive collection on this subject. It consists of professional journals, monographs, conference proceedings, etc.

This collection is available for perusal to library science students and is also in the process of being computerised.

**Folklore Collection**

This is a very important collection where the oral literature is presented in the form of writings and audio visual media. There are 672 manuscripts alone written by Mr. Peter Wijesinghe an eminent folklorist in Sri Lanka. Folklore, Folk poetry, customs, folk beliefs and worship, culinery habits, gods and godesses, construction of ancient irrigation tanks, agriculture traditions names of villages and bee keeping are some of the topics in the collection. Moreover " ඌවේ ජනකවි (Uve Janakavi) is a printed anthology of folk poetry which is based on the material contained in the NL Collection. Further attempts have been made topreserve folk songs such as Nelum Kavi, Kamath Kavi, Music of Asia Asian cultural heritage in the form of audio visuals. The entire collection has been catalogued and made available for use.

In view of the above resources it is evident that there is a void of fugitive materials such as unpublished reports, memoranda seminar & conference proceedings and local audiovisual products in the NL. It is rather a difficult task to obtain these material under the existing procurement methods. Therefore it is vital to device a scheme to ensure regular flow of such material to enrich the NL resources and in this context, priority should be given to formulate a new NL legislation.

# පුවත් ලුහුඬින්

## සංවර්ධන හා පර්යේෂණ සේවා

### පොත් පරිත්‍යාග

පොත් පරිත්‍යාග සේවා යටතේ පාසැල් පුස්තකාල 128 ක් සඳහා රු. 2,79,784.64 ක් වටිනා පොත් පරිත්‍යාගයක් ද, මහජන පුස්තකාල 17 ක් සඳහා රු. 54,072.10 ක් වටිනා පොත් පරිත්‍යාගයක් ද, පිරිවෙන් හා සුභ සාධක ස්වෙච්ඡා ආයතන පුස්තකාල 101 ක් සඳහා රු. 2,10,531.35 ක් වටිනා පොත් පරිත්‍යාග පසුගිය හය මස තුළ දී සිදු කර ඇත. පරිත්‍යාග කරන ලද පොත් ප්‍රමාණය අනුපිළිවෙලින් පාසල් සඳහා 9,718 ක්ද, මහජන පුස්තකාල සඳහා 1,827 ක්ද, අනෙකුත් ආයතන පුස්තකාල සඳහා 7,419 ක් ද වේ.

### පොත් පිරුළු සේවාව

මේ යටතේ මැද කොළඹ, කෝට්ටේ, කොලොන්නාව, සහ ගම්පහ යන අධ්‍යාපන මණ්ඩලවල පාසල් පුස්තකාල 12 ක් සඳහා පොත් කට්ටල් ලබාදී ඇත.

### රන්ෆර්ලි පොත් ආධාර

මේ යටතේ විවිධ පුස්තකාල 29 ක් සඳහා පොත් 1,241 ලබා දෙන ලදී.

### පුස්තකාල වෘත්තීය උපදෙස් සැපයීම

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩලවලට අයත් විශේෂ පුස්තකාල 5 ක් සඳහා වෘත්තීය උපදෙස් ලබා දී ඇත.

### පුස්තකාලයාධිපතිවරුන්ගේ තනතුරු ශ්‍රේණිගත කිරීම

පුස්තකාල 35 ක පුස්තකාලයාධිපතිවරුන් 34 දෙනෙකු III ශ්‍රේණියට ද, එක් පුස්තකාලයාධිපතිවරයෙකු II ශ්‍රේණියට ද ඇතුළත් වන පරිදි ශ්‍රේණිගත කොට සංශෝධිත වැටුප් තලයන්හි පිහිටුවීමට අවශ්‍ය අනුමැතිය ලබාදී ඇත.

### පොත් අලෙවි සේවාව

වැලිගම සහ බදුල්ලේ පැවැති රාජ්‍ය සාහිත්‍ය උත්සවයන්හිදී සහ ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය, කටුබැද්ද සංස්කෘතික කේන්ද්‍රය හා කොළඹ විශ්ව විද්‍යාලය යන ස්ථානවල පවත්වන ලද පොත් අලෙවි සේවා මගින් රු. 95,642.21 ක ආදායමක් උපයා ගන්නා ලදී.

### ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය

මුද්‍රිත පොත් මිලදී ගැනීම යටතේ රු. 4,66,396.50 ක වටිනාකමින් යුත් ග්‍රන්ථ වර්ග 132 ක් මිල දී ගන්නා ලදී.

### පොත්, මාණ්ඩලික ප්‍රකාශන හා පුස්තකාල ලිපි ද්‍රව්‍ය අලෙවිය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් අලෙවි සැලෙන් රු. 1,15,580.42 ක් වටිනාකමින් යුත් පොත් 3,901 ක්ද, රු. 9,514.90 ක් වටිනා මාණ්ඩලික ප්‍රකාශන 314 ක් ද රු. 30,270.45 ක් වටිනා පුස්තකාල ලිපි ද්‍රව්‍ය ප්‍රමාණයක් ද මේ කාලය තුළ මහජනයාට අලෙවි කොට ඇත.

### මාණ්ඩලික ප්‍රකාශන

කළුතර දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණය හා ගුරු අභ්‍යාස විද්‍යාල පුස්තකාල සමීක්ෂණය මුද්‍රණය වෙමින් පවතී.

### පොත් ප්‍රකාශන ආධාර

1990 වසර තුළ නව ග්‍රන්ථ 104 ක් ප්‍රකාශයට පත් කිරීම සඳහා පුස්තකාල සේවා මණ්ඩලය අනුග්‍රහය දක්වා ඇත. මෙම ග්‍රන්ථ 104 ට නවකතා 28, කෙටිකතා 20, පද්‍ය 06, නාට්‍ය 07, පරිවර්තන කෙටි කතා 02, පරිවර්තන නාට්‍ය 01, ආගම 04, සමාජ විද්‍යාව 08, භාෂාව 02, විද්‍යාව 04, තාක්ෂණය 05, කලා 09, සාහිත්‍ය 04, ඉතිහාසය 04 ක් වශයෙන් ඇතුළත් වේ. ග්‍රන්ථ 100 ක් සිංහල භාෂාවෙන්ද, 03 ක් ඉංග්‍රීසි භාෂාවෙන්ද, 01 දෙමළ භාෂාවෙන්ද රචිතය.

1991 වර්ෂය සඳහා අත්පිටපත් බාර ගැනීම 1990 සැප්තැම්බර් 15 දින සිට නොවැම්බර් 15 තෙක් සිදුවිණි. ලැබුණු නව අත්පිටපත් 372 න් නවකතා 92, කෙටිකතා 58, පද්‍ය 60, නාට්‍ය 19, මිශ්‍ර 01, පරිවර්තන කෘති 16, සාමාන්‍ය 05, දර්ශනය 08, ආගම 09, සමාජ විද්‍යාව, 28, භාෂාව 02, විද්‍යාව 16, තාක්ෂණය 16, කලා 20, සාහිත්‍ය 08, ඉතිහාසය 14 ක් වශයෙන් වෙන් කළ හැක.

## ග්‍රන්ථ විඥාපන සේවා

### ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන)

1990 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය සමඟ "ප්‍රකාශන පූර්ව ග්‍රන්ථ නාමාවලිය" නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. එමගින් ඉදිරි හය මස තුළ ප්‍රකාශයට නියමිත පොත්පත් පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කෙරේ. මුද්‍රණ වියදම අධිකවීම නිසා 1990 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියෙහි වාර්ෂික දායක මුදල රු. 180.00ක් වේ.

### පූර්වකාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

1962 වර්ෂයේ මෙරට පළවූ සිංහල දෙමළ හා ඉංග්‍රීසි පොත් පිළිබඳ ග්‍රන්ථනාමාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රලේඛනය වෙමින් පවතී. මෙම ග්‍රන්ථනාමාවලියට අයත් පූර්වකාලය වනුයේ 1962–1885 අතර කාලයයි.

### ළමා ග්‍රන්ථ නාමාවලිය

1989 වර්ෂයේ ළමා ග්‍රන්ථ නාමාවලිය දැනට යුහුසුළුව සකස් වෙමින් පවතී.

## පුස්තකාල අධ්‍යාපන හා පුහුණු සේවා

### පාසල් පිරිවෙන් හා මහජන පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු පාඨමාලා

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගුරු පුස්තකාලාධිපතීන් 35 ක් සඳහා පාඨමාලාවක් 1990.07.26 සිට 29 දක්වා නොච්චියාගම විද්‍යාදර්ශ විද්‍යාලයේ දී පවත්වන ලදී. මෙම කාලසීමාව තුළදීම පිරිවෙන් භාර පුස්තකාලයාධිපතීන් 18 දෙනෙකු සඳහා පාඨමාලාවක් අනුරාධපුර සිරිසඟබෝ භාවනා මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසැල් භාර ගුරු පුස්කකාලයාධි-පතීන් 59 දෙනකුගේ සහභාගීත්වයෙන් තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයේ දී 1990.09.12 සිට 15 දක්වා පාඨමාලාවක් පවත්වන ලදී. 1990.09.26 සිට 29 දක්වා පොලොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ පවත්වන ලද පාඨමාලාවට දිස්ත්‍රික්කයේ පාසල් භාර ගුරු පුස්තකාලයාධිපතීන් 35 ක් සහභාගි විය.

මාතලේ ධර්මරාජ පිරිවෙන්හි 1990.10.10 සිට 13 දක්වා දිස්ත්‍රික්කයේ ගුරු හා පිරිවෙන් පුස්තකාලයාධිපතිවරුන් සඳහා පාඨමාලා දෙකක් පවත්වන ලදී. මේ සඳහා ගුරුමහත්ම මහත්මීන් 46 ක් ද, ගිහි පැවිදි පිරිවෙන් පුස්තකාලයාධිපතිවරුන් 24 ක් ද සහභාගි විය.

රුවන්වැල්ල ප්‍රදේශීය සභාවේ මෙහෙයවීම මත කෑගල්ල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල සහායක වරුන් සඳහා දෙදින පුහුණු පාඨමාලාවක් පාඨමාලාභීන් 26 දෙනකුගේ සහභාගීත්වයෙන් 1990.06.07 දිනයන්හි දී රුවන්වැල්ල මහජන පුස්තකාලයේ දී පවත්වන ලදී.

මහජන පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල සහායක වරුන් 60 දෙනකුගේ සහභාගීත්වයෙන් පාඨමාලා 02 ක් ඇඹිලි-පිටියේ ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස් ථානයේ දී 1990.12.10 සිට 13 දක්වා පවත්වන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනසවිලාභී ජංගම පුස්තකාල භාරකාරවරියන් 30 දෙනකු සඳහා පුහුණු පාඨමාලාවක් 1990.07.04 සිට 06 දක්වා ද 1990.12.11 දින එක්දින සම්මන්ත්‍රණ යක්ද ඇඹිලිපිටිය ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ මධ්‍යස්-ථානයේ දී පවත්වන ලදී.

### සේවාස්ථ පුහුණුවීම් හා ජාතික පුස්තකාලය නැරඹීමේ අධ්‍යයන චාරිකා

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම වර්ෂ සිසුන් සහ කැලණි විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා සිසුන් සඳහා පාඨමාලා හා අධ්‍යයන චාරිකා 02 ක් පවත්වන ලදී.

### ජාතික පුස්තකාල දේශන මාලා

''සිංහල අක්ෂර මාලාවේ උපත හා විකාශය'' මැයෙන් මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා 1990 ජූලි 26 දින ජාතික පුස්තකාල දේශනමාලා අංක 02 පවත්වන ලදී. 1990 අගෝස්තු 29 දින ''ජාතික ලේඛනාගාරයේ වගකීම හා කාර්යභාරය'' මැයෙන් ආචාර්ය කේ. ඩී. ජී. විමලරත්න මහතා දේශනමාලා අංක 03 පවත්වන ලදී. ''Telecommunication Development in Sri Lanka Present Trends and Furture Prospects'' මැයෙන් පී. කේ. වික්‍රමාරච්චි මහතා විසින් 1990.09.26 දින දේශනමාලා අංක 04 පවත්වන ලදී.

දේශනමාලා අංක 05 යටතේ 1990.10.29 දින ''ජනසන්නි-වේදන ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා'' මැයෙන් එඩ්වින් ආරියදාස මහතා දේශනයක් පවත්වන ලදී. ''ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගැටළු සහ ප්‍රවනතා'' මැයෙන් හෙන්රි සමරනායක මහතා 1990.11.28 දින දේශනමාලා අංක 06 පවත්වන ලදී. 1990.12.21 දින පැවැත් වූ දේශනමාලා අංක 07 සඳහා මාතෘකාව වූයේ ''Rare Books about (Ceylon) Sri Lanka 17th–19th Centuries a historical Survey'' යන්නයි. විල්ෆ්‍රඩ් එම්. ගුණසේකර මහතා විසින් මෙම දේශනය පවත්වන ලදී.

සාහිත්‍ය මාසය නිමිත්තෙන් 1990.09.17 වන දින ''නූතන ඉන්දියානු සාහිත්‍ය පරිවර්තන'' මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

### විදේශීය චාරිකා

''පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම'' මැයෙන් 1990.12.09 සිට 14 දක්වා ඉන්දියාවේ කල්කටා නුවර පැවැත්වූ වැඩ මුළුව සඳහා සභාපතිනී ඊශ්වරී කොරයා මහත්මිය සහ සහකාර පුස්තකාලයාධිපතිනී ඩී. එම්. තිලකරත්න මහත්මිය සහභාගි විය.

## ප්‍රාදේශීය පුවත්

අනුරාධපුර මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී 1990.10.13 දින පාඨක සමාජයක් පිහිටුවා ගන්නා ලදී. මෙමගින් ප්‍රදේශයේ ළමයින්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණින් **පාඨක පුවත්** නමින් අර්ධ වාර්ෂික සඟරාවක් පලකිරීමට අදහස් කර ඇති බව පුස්තකාල ප්‍රවෘත්ති වෙත දන්වා ඇත.

# පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙල
# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

( ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙල අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් 1990 ජුලි සිට දෙසැම්බර් දක්වා පළ කර ඇත. )

| විෂය | කර්තෘ | ග්‍රන්ථ නාමය |
|---|---|---|
| ජනසන්නිවේදනය | නෙල්සන් ජයවීර | ගුවන් විදුලි සන්නිවේදනය |
| | මාදුරුඔය ධම්මිස්සර හිමි | බෞද්ධ සන්නිවේදනය |
| පරි. දර්ශනය | මහාචාර්ය විමල විජේසූරිය (චානක්‍ය) | චානක්‍ය ශතකගීය සහ චානක්‍ය ශතකම් (චානක්‍යගේ චානක්‍ය ශතක ගීය) |
| ආගම | හැඩවින්නේ තේජෝරන්සි හිමි | අපරාධ පිළිබඳ බෞද්ධ මතය |
| | පණ්ඩිත බෝපිටියේ ඤාණාවාස හිමි | දම් සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේ |
| | වෙ.වි. අභයගුණවර්ධන | පරිවාර ගණ්ඨිපදය |
| | ඩබ්ලිව්. එම්. ප්‍රේමචන්ද්‍ර ද අල්විස් | සූත්‍රපිටක සූචිය සහිත සූත්‍ර සම්පිණ්ඩනය |
| සමාජ විද්‍යා | ආචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු | සංස්කෘතිය සමාජය සහ පෞරුෂය |
| | මහාචාර්ය තිස්ස කාරියවසම් | ගම්මඩු පුරාණය |
| | Gamini De S. G. Punchihewa | Souvenirs of a Forgotten Heritage |
| නීතිය | කේ. කරුණාතිලක | අපරාධ විද්‍යා ප්‍රවේශය |
| ගමනාගමනය | බී. ඒ. හේමපාල | අශ්ව කෝච්චියෙන් ආකාශ යාත්‍රාවට |
| ජනශ්‍රැති | ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර ද මැල් | ජනශ්‍රැතිය සහ පෝලන්තයේ ජන කතා |
| විද්‍යාව | ඒ. එම්. එස්. ඩබ්ලිව්. අමරකෝන් | සිවිකාව |
| | සුනිල් මද්දුමගේ | ඔසු කැඳ-ඔසු පැන් |
| | සනත් කරුණාසේකර | ශ්‍රී ලංකාවේ සම්පත් රසායනය |
| ගණකාධිකරණය | යූ. කේ. සුනිල් කරුණාරත්න | ගණකාධිකරණ සංකල්ප හා ප්‍රමිති |
| කලා | නිසිත වර්ණසූරිය | චලන චිත්‍රයේ කතාව |
| | සුසිල් ගුණරත්න | ධම්ම ජාගොඩ රූපවාහිනී සංකල්ප |
| සංගීතය | රත්න ශ්‍රී විජේසිංහ | වංක ගිරිය අරණේ |
| | ප්‍රණීත් අභයසුන්දර | සංහිඳ පාමුල |
| | රණදේව අල්විස් | ඩෝල්ටන් අල්විස් කාව්‍ය ගීත සංග්‍රහය |
| | මර්සලින් ජයකොඩි පියතුමා | වෙසක් කැකුළු අතු අග හිඳ |
| | රෝහණ දන්දෙණිය | තල්වැට අයිනේ |
| | සමන්ත හේරත් | ප්‍රියංවද |
| | සමන් චන්ද්‍රනාත් වීරසිංහ | අපේ කාලේ සරස්වතී |
| ක්‍රීඩා | ලලිත් ගුණවර්ධන | ඔලිම්පික් ගිය අපේ හපන්නු 1948-1968 |
| සාහිත්‍යය | අහුන්ගල්ලේ විමලනන්දි තිස්ස හිමි | ජිනබෝධාවලී |
| | වැගම පියරතන හිමි | පාලි අට්ඨ කතාවන්හි පිළිබිඹුවන ව්‍යාකරණ සම්ප්‍රදාය |
| | රංජිත් ජයසේකර සිරිවර්ධන | සිංහල කාව්‍ය විමර්ශනය |
| ඉතිහාසය | ආචාර්ය යූ. බී. කරුණානන්ද | නුවර කලාවිය 1815-1900 |
| | Prof. Vinie Vitarana | The Night of Doom |
| නවකතා | එම්. එච්. එම්. නිමල් බණ්ඩාර | තෙල්ලිකැලේ වීරයෝ |
| | හේමා ලියනගේ | දෙලොවක් අතර |
| | කරුණාරත්න මාකඩුවාව | සාමෙලා කමතට ඇවිත් |

| | | |
|---|---|---|
| | ප්‍රේමදස රොඩ්රිගෝ | අසත්පථය |
| | සිරිල් ගමගේ | උත්සාහය උක් දණ්ඩක් වැන්නේ |
| | චන්ද්‍රරත්න බණ්ඩාර | මෙරු |
| | සිරිසේන ඒකනායක | මැණික් රාළ මාමා |
| | කිත්සිරි කාරියප්පෙරුම | විමුක්ති |
| | සත්‍ය දයාරත්න | වස්සානය |
| | පර්ල් ආර්. කංකානම්ගේ | ත්‍රිකෝණ අරගලය |
| | පී. නීතා මාලනී බණ්ඩාර | තුරු සෙවනක පිපුණු මලක් |
| | රොහාන් පියදස | අහසින් ආ අහන |
| | කුසුම් ඒකනායක | නාග කන්‍යාව |
| | කුලසේන පොන්සේකා | උඩු සුළඟ |
| | නිමල් සේදර | සිවු මැදුර |
| | සෝමාදේවි පරණයාපා | සත් සයුර ගොඩගලා |
| | දයාරෝහණ අතුකෝරාල | බාඳුරා මල් |
| | K. M. M. Sheriff | Ovvamunai Kanthankal |
| පරි. නවකතා | I. Siriwardane<br>(අයිලින් සිරිවර්ධන) | On Perilous Seas<br>(වෙරලෙන් සයුරට) |
| | ජයන්ත විමලසේන<br>(Yuklo Mishima) | රළ පෙරළිය<br>Shiosai (The Sound of Waves) |
| කෙටි කතා | මුනිදස සෝමතිලක | අතුරේ යන මිනිස්සු |
| | ධර්මසේන පෙරේරා | ගමට ඇවිත් |
| | ජයතිලක කම්මැල්ලවීර | තවත් කමලාවියක් |
| | නීලා ගුණසේකර | කිරිසප්පයා |
| | එරික් ඉලයප්පආරච්චි | වඩදිය |
| | ආර්. අමරදස | ගොනා, කපුටා සහ මැස්සෝ |
| | ජයවඩු විතාන | බිම දිග දුවන වැල් |
| | ආර්. එම්. විමලරත්න | ගවරා සහ පැටව් |
| | යසවර්ධන රුද්‍රිගු | ගලන වතුර බොරපාටයි |
| | වයලා තලංගම | මුහුදු කුමාරිය සහ වෙනත් කතා |
| | කේ. ජී. ප්‍රේමරත්න | යන්ත්‍ර සූත්‍ර කාරයෝ සහ වෙනත් කතා |
| | අලවත්තාගොඩ පේමදස | කාලීන කාලගෝල කතා |
| | සාලිය සේනාසේකර | බාලදක්ෂයෝ |
| | චාන්දනී දේවිකා පුංචිහේවා | දෙදරුවෝ |
| | බන්දුපාල ගුරුගේ | හාමතේ ගීතය සහ තවත් කෙටිකතා |
| | හසන්ත ශ්‍රී ලාල් හෙට්ටිආරච්චි | උරුමෙද කරුමෙද |
| පරි. කෙටිකතා | ලාල් පෙරේරා | දේශපාලනඥයා සහ තවත් තායිලන්ත |
| | සත්‍යපාල ගල්කැටිය | කෙටිකතා උත්තර භූමිය |
| | ලාල් ප්‍රෙමනාත් ද මැල් | බඩු උගස්ගන්නාගේ බිරිඳ සහ වෙනත් ජපන් කෙටිකතා |
| පද්‍ය | වජිර නාරම්පනාව | සතර පෙර නිමිති |
| | තිලකරත්න කුරුවිට බණ්ඩාර | ඉකුත්වත |
| නාට්‍ය | ලෙස්ලි බී. සිරිමාන්න | මහද්දන මුත්තාගේ අළුත්ම පාඩම |
| | කරුණාතිලක හඳුවල | ගුවනේ පාවු නාට්‍යය |
| | ජයලත් මනෝරත්න | ගල්වඩු රාළ |
| | සෝමා ජයකොඩි | වැලහින්නගේ ප්‍රේම කතාව සහ තවත් ගුවන් විදුලි නාට්‍ය |
| | හඳුන්ගේ සරණපාල | චාරුමිත්‍රා |
| පරි. නාට්‍යය | අශෝක පීරිස් (Paul Landis) | ප්‍රභූ (Six Plays by Plerre Corneille and Racine) |

ඉහත සඳහන් සියලුම කෘතීන් 15% විශේෂ වෙළඳ වට්ටම් යටතේ මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල හා සුභ සාධක පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිළ දී ගත හැක.



**"පුස්තකාල ද්‍රව්‍ය සංරක්‍ෂණය හා ආරක්ෂණය"**
මැයෙන් ඉන්දියාවේ කල්කටා හි
පැවති වැඩමුළුව සඳහා ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිනි
**ඊශ්වරී කොරයා** මහත්මිය සහභාගී වෙමින්......

බැංකොක් හි පැවති, සමාජ විද්‍යා ප්‍රලේඛන
කටයුතු පිළිබඳ ආසියා පැසිපික් කලාපීය
උපදේශක සමුළුවට ශ්‍රී ලංකා ජාතික
පුස්තකාලයේ අධ්‍යක්‍ෂ **උපාලි අමරසිරි** මහතා
සහභාගී වෙමින්......





වාර්ෂික දායක මුදල රු. 30/-

මිල රු. 15/-

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කැලණිය විද්‍යාලංකාර මුද්‍රණාලයේ මුද්‍රණය කරවන ලදී.